**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය - 2023**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අහිතකර මතය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ “මණ්ඩලය” 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා මතය වේ.

### 1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අහිතකර මතයක් නිකුත් කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතිය යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 (LKAS 01) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රමිතිය අනුව, මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සියළුම ගිණුම් සඳහා පෙර කාල සීමාව සම්බන්ධයෙන් සන්සන්දනාත්මක ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු වුවත්, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 21 හා 22 ලෙස ඉදිරිපත් කර තිබූ පිළිවෙලින් රියදුරු පුහුණු පාසල් හා ඉන්ධන පිරවුම්හලට අදාළ ලාභ හා අලාභ ගිණුම් සඳහා සන්සන්දනාත්මක ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | 2005 වර්ෂයේ ශ්‍රී ලං.ග.ම. බවට පත්කරන ලද අවස්ථාවේ සිට මේ දක්වා ඉන්ධන පිරවුම්හල් සහ රියදුරු පුහුණු පාසැල් යන ඒකක සඳහා ලාභය වෙන වෙනම ගණනය කර මූල්‍ය වාර්තාවල සටහන් තුල වාර්තා කිරීමට කටයුතු කරන ලදී. නමුත් එම ඒකක වලට අදාළව පෙර වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වර්ෂ දෙකකටම අදාළව පෙන්නුම් කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතයට අනුව සන්සන්දනාත්මක ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු බව. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 (LKAS 01) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රමිතියෙහි 35 වගන්තිය ප්‍රකාර විදේශ විනිමය ලාභ හා අලාභ ප්‍රමාණාත්මක භාවයෙන් වැඩි නම් ගිණුමෙහි වෙනම වාර්තා කළ යුතු වුවද, අමතර කොටස් මිලදී ගැනීම් සඳහා ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් නොකිරීමට එරෙහිව සැපයුම්කාර සමාගමක් විසින් පවරා තිබූ බේරුම්කරණ නඩුවක් හේතුවෙන් සැපයුම්කරුට ගෙවීමට තිබූ මුදල හා පොලී මුදල් වලට අදාළ ඩොලර් වටිනාකම බේරුම්කරණ තීන්දුව ප්‍රකාශයට පත් කළ 2019 මැයි 09 දිනැති නියෝගය අනුව නිරවුල් නොකිරීම මත හා එම මුදල් 2023 වර්ෂයේදී ගෙවීම් කිරීම හේතුවෙන් රුපියලේ අගය අවප්‍රමාණය මත අවප්‍රමාණික වටිනාකම ලෙස සැපයුම්කරුට වැඩියෙන් ගෙවීමට සිදුව තිබූ රු.462,892,919 ක මුදල සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල වෙනම අනාවරණය කර නොතිබුණි. | බේරුම්කරණයට අදාළ සියලුම ගෙවීම් මේ වන තෙක් ගෙවීම් කර අවසන් නොමැති බැවින් මීට අදාළව ගෙවීමට සිදුවන සම්පූර්ණ මුදල ශ්‍රී ලංකා රුපියල් වලින් තීරණය කිරීමේ අපහසුවක් පවතී. එබැවින් මෙම ගෙවීම් කටයුතු නිරවුල් කිරීමෙන් අනතුරුව ඊට අදාළ ගැළපීම් මූල්‍ය වාර්තා වලට ගැළපීම් කිරීමට කටයුතු කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිතයට අනුව විනිමය අලාභ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (LKAS 07) හි 35 වන වගන්තියට අනුව බදු වලින් පැන නගින මුදල් ප්‍රවාහයන් වෙනම අනාවරණය කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරය වෙත ගෙවන ලද රු.145,000,000 ක බදු වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ අනාවරණය කර නොතිබුණි. | ලාභාංශ ගෙවීමෙන් පසු ලාභය පදනම් කර ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීම ආරම්භ කර ඇති නිසා එම ලාභාංශ ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ඇතුළත් වී ඇත. | ගිණුම් ප්‍රමිතියට අනුව බදු හෝ ලාභාංශ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ වෙනම අනාවරණය කළ යුතු බව. |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (LKAS 07) හි 20 (9) වගන්තියට අනුව වක්‍ර ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසීමේදී අදාළ කාල පරිච්ඡේදයෙහි කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ලෙස තොගයෙහි, ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂවල වෙනස් වීම පමණක් ගැලපිය යුතු වුවද, ජංගම නොවන වගකීම් යටතේ සාවද්‍ය ලෙස ගිණුම්ගත කර තිබූ ශේෂය වූ රු.1,860,824,837 ක ශේෂය පොත් වලින් ඉවත් කිරීමේදී එම ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ කාරක ප්‍රාග්ධන වෙනස් වීම් යටතේ සාවද්‍ය ලෙස ගැලපීම් කර තිබුණි. ඒ හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂයේ මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් අඩු වී තිබුණි. | මෙම සාවද්‍ය ගෙවිය යුතු වටිනාකම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව ශ්‍රී ලංගම ගිණුම් කට්ටලය තුළ නිවැරදි කිරීම් කර ඇත. මෙම ගෙවිය යුතු මුදල පියවීම මූල්‍ය ක්‍රියාකාරකමක් හෝ ආයෝජන ක්‍රියාකාරකමක් නොවන අතර, මෙහෙයුම් ක්‍රියාකාරකමක් ලෙස ගත යුතුය | ගිණුම්කරණ ප්‍රමිතියට අනුව ජංගම නොවන වත්කම් සාවද්‍ය ලෙස කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ ගැලපීම් සිදු නොකිරීමට වග බලා ගත යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 (LKAS 16) හි 73 ඡේදයට අනුව දේපල, පිරියත හා උපකරණවල ඵලදායි ජීව කාලය හෝ ක්ෂය ප්‍රතිශතය අවසන් ගිණුම් සටහන්වල හෙළිදරව් කළ යුතු වුවත් ප්‍රවර්තන වර්ෂය තුළදී පරිගණක මෘදුකාංග සියයට 33.33 ක ප්‍රතිශතයකින් රු.3,275,225 ක වටිනාකමට, ටිකට් යන්ත්‍ර සියයට 25 ක ප්‍රතිශතයකින් රු.5,192,034 ක වටිනාකමට, වායුසමන යන්ත්‍ර සියයට 10 ක ප්‍රතිශතයකින් රු.1,676,088 ක වටිනාකමට හා වෙනත් වත්කම් සියයට 10 ක ප්‍රතිශතයකින් රු.5,362,939 ක වටිනාකමට ක්ෂය කර තිබූ නමුත්, එම වත්කම්වල ක්ෂය ප්‍රතිශතයන් අවසන් ගිණුම් සටහන් තුළ හෙළිදරව් කර නොතිබුණි. | ටිකට් යන්ත්‍ර, පරිගණක සඳහා වූ ක්ෂය ප්‍රතිපත්තිය තුළ ඇතුළත් වන අතර, වෙනත් වත්කම්, වායු සමීකරණ, කාර්යාල උපකරණ සහ යන්ත්‍ර, යනාදිය යන්ත්‍රෝපකරණ යටතේ නිරූපණය කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතයට අනුව ක්ෂය ප්‍රතිශතයන් ගිණුම් සටහන්වල හෙළිදරව් කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 (LKAS 16) හි 07 ඡේදයට අනුව දේපල, පිරියත හා උපකරණයක පිරිවැය වත්කමක් ලෙස හඳුනා ගැනීමට නම් එම වත්කමෙහි අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්ථිත්වය තුළට ජනිත කරවීමේ හැකියාවක් පැවතිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගිණුම්ගත කර තිබූ රු.1,367,754,792 ක් වූ භාවිතයට ගත නොහැකි ලෙස අබලි වූ බස් රථ සහ රු.1,041,195 ක් වූ භාවිතයට ගත නොහැකි ලෙස අබලි වූ අනෙකුත් වාහන තවදුරටත් දේපල, පිරියත හා උපකරණ | 2005.10.19 වන දිනැති 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත මඟින් සියළුම සේවා ස්ථාන සහ සමාගම් ඒකාබද්ධ කරමින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවා ඇත. ඒ අනුව විමසුමෙහි පෙන්වා දී ඇති ශේෂයන් 2005.10.18 දිනට සකසන ලද ඒකාබද්ධ | ගිණුම්කරණ ප්‍රමිතයට අනුව වත්කම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත කළ යුතු අතර, නිවැරදි වත්කම් උපලේඛන විගණනයට ඉදිරිපත් කළ |

| | | | |
|---|---|---|---|
| | ලෙස ගිණුම්ගත කර තිබූ අතර, ඒ සම්බන්ධයෙන් වූ උපලේඛන ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි | ගිණුම් තුළ නිරූපණය වූ දීර්ඝ කාලයක් පවතින වත්කම් ශේෂ වේ. | යුතුය. |
| (උ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 (LKAS 16) හි 37 වන ඡේදයට අනුව ආයතනයක දේපළ, පිරියත හා උපකරණ කාණ්ඩ ගත කළ යුතු වුවත්, 2023 දෙසැම්බර් 31 දිනට රු.75,842,984 ක් වටිනා වත්කම් කාණ්ඩය හඳුනා නොගත් වෙනත් වත්කම් ශේෂයක් පවතින අතර, ඉදිරිපත් කර තිබූ එම වත්කම්වලට අදාළ පිරිවැය, සමුච්චිත ක්ෂය, වාර්ෂික ක්ෂය වටිනාකම හා ධාරණ අගය වෙනම දක්වා නොතිබුණි. | වෙනත් වත්කම් ශේෂය තුළ 2016 වර්ෂයට පෙර ශේෂයන් මෙන්ම 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මිලදී ගත් වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකි වත්කම් ද ඇතුලත් වී ඇත. 2016 වර්ෂයෙන් පසු සියළුම වත්කම් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ඇති අතර, ඊට පෙර ශේෂය වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට නොහැකිය. | ගිණුම්කරණ ප්‍රමිතයට අනුව දේපල පිරියත හා උපකරණ කාණ්ඩගත කර වත්කම් වල පිරිවැය, සමුච්චිත ක්ෂය, වාර්ෂික ක්ෂය හා ධාරණ අගය වෙනම දැක්විය යුතුය. |
| (ඌ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 (LKAS 16) හි 31 වන ඡේදයට අනුව වත්කමක් ලෙස හඳුනා ගැනීමෙන් පසු එම වත්කමේ ආයු කාලය තුළ සමුච්චිත ක්ෂය හා හානිකරණ පාඩු අඩුකිරීමෙන් පසු එකී වත්කමේ සාධාරණ අගය විශ්වාසනීයව මැනිය හැකි විට එම වත්කම අයිතමයක් ලෙස හෝ සමූහයක් ලෙස නැවත තක්සේරු කළ යුතුය. නමුත් 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සතුවූ ශුද්ධ අගය රු.1,000 ක් වූ බස් රථ 2,715 ක්, කල්බදු බස් රථ 2,586 ක් හා එන්ජින් 1,305 ක් ගිණුම් තුළ පෙන්වා තිබුණද එම බස් රථ වලින් සියයට 83 ක් වර්තමානය වන විට ධාවන කටයුතුවල නිරත බැවින්, ධාවනයට යොදවා තිබූ එම බස් රථවල සාධාරණ අගය ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | මෙම බස් රථ වල ශුද්ධ අගය රු.1,000/- ක් ලෙස දීර්ඝ කාලයක සිට සටහන් කර ඇත්තේ ඒවා වත්කම් ලේඛනයෙන් ඉවත් නොකර තබා ගැනීම සඳහාය. කෙසේ වෙතත් LKAS 16 හි අනු අංක 36 අනුව අදාළ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා සම්පූර්ණ වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු අතර බස්රථ ප්‍රත්‍යාගණනය සම්පූර්ණයෙන් කිරීම සඳහා විශාල කාලයක් මෙන්ම ඒ සඳහා විශාල වියදමක් දැරීමට සිදුවේ. | ගිණුම්කරණ ප්‍රමිතයට අනුව වත්කම් නිවැරදිව ප්‍රත්‍යාගණනය කර ප්‍රත්‍යාගණිත වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 (LKAS 18) අනුව සේවා සැපයීම සම්බන්ධයෙන් වූ ගණුදෙනු මත ආදායමේ ප්‍රමාණය විශ්වාසදායක ලෙස මැනිය හැකි විට හා ගණුදෙනුව සම්බන්ධව ආර්ථික ප්‍රතිලාභ පවතින බවට හා ඒවා ආයතනය තුළට ගලා එන විට, වාර්තා කරන කාලය අවසානයේ ගණුදෙනුව අවසන් කිරීමේ අදියර විශ්වාසදායක ලෙස මැනිය හැකි වීම අනුව වෙනම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත්, අශෝක් ලේලන්ඩ් සමාගමේ බස් රථ යොදවා අධිවේගී මාර්ගවල ශ්‍රී ලංගමයට අයත් ගමන් වාර ආවරණය කිරීම තුළින් 2023 වර්ෂයේදී මාර්ග ලේඛන ආදායම් ලෙස රැස් කර ගත් | ලැබෙන දෛනික ආදායම "කුළී බස් රථ ආදායම් ගිණුම" ට බැර කළ යුතු වන අතර, ඉන්ධන, ප්‍රසාද දීමනා, සේවක වේතන සහ පිවිසුම් ගාස්තු කුලී බස්රථ ආදායම් ගිණුමට හර කළ යුතුය. එම ගිණුමෙහි ශුද්ධ අගය 85% සහ 15% ලෙස බස්රථ හිමිකරු සහ ශ්‍රී ලං.ග.ම. අතර, බෙදා ගනු ලබයි. ශ්‍රී ලං.ග.ම. ට අදාළ 15% ක ප්‍රමාණය කුළී බස්රථ | ගිණුම්කරණ ප්‍රමිතයට අනුව උපයා ගත් මාර්ග ලේඛන ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.1,019,797,453 ක මුදල හා විශේෂ වාරිකා අවරණය වෙනුවෙන් උපයාගත් රු.7,499,648 ක ආදායම වශයෙන් එකතුව රු.1,027,297,101 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ආදායම ලෙස ගිණුම් ගත කර ඇත. එය 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 17 යටතේ දක්වා ඇත. | |
| (ඒ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 (LKAS 19) අනුව විශ්‍රාම ප්‍රතිලාභ ගිණුම් තැබීමේදී පාරිතෝෂික ගිණුම් තැබීම සඳහා නිර්වචනය කළ ප්‍රතිලාභ සැලැස්මට අනුව හා විධිමත් සමීකරණයකට අනුව වර්තමාන සේවා පිරිවැය හා පාරිතෝෂික වෙන් කිරීම් වර්තමාන වටිනාකමට ගණනය කර තිබූ නමුත්, 2023 ජනවාරි 01 දිනට සැලසුම් වගකීම් (Plan Liability) ගිණුමේ ශේෂයට උපචිත පොලිය වන රු.1,037,220,225 ක මුදල සහ ආයුගණක ලාභය (Actuarial Gain) වන රු.90,742,519 ක මුදල සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල වෙන වෙනම අනාවරණය කර නොතිබුණු අතර, එම අගයන් දෙකෙහි ශුද්ධ අගය වන රු.946,477,706 ක මුදල විශ්‍රාම ප්‍රතිලාභ ඌනතාවයක් ලෙස අනෙකුත් විස්තීරණ ආදායම් යටතේ සාවද්‍ය ලෙස ගිණුම්ගත කර තිබුණි. | (LKAS 19) අනුව පාරිතෝෂිත වෙන් කිරීම සිදු කරනු ලබයි. 2005 වර්ෂයේ සිට විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි පාරිතෝෂිත ගෙවීම් කිරීම සඳහා අරමුදලක් ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.ආයෝජන කටයුත්තක් සිදු නොවී ඇති පසුබිමක 2023 ජනවාරි 01 දිනට පැවති ශේෂය මත උපචිත පොලී ගණනය කිරීමක් සහ ඒ සඳහා වෙන් කිරීමක් සිදු කළ නොහැක. | ගිණුම්කරණ ප්‍රමිතයට අනුව සැලසුම් වගකීමට අදාළ උපචිත පොලිය හා ආයුගණක ලාභය නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඔ) | සමාලෝචිත වර්ෂය තුළ සෑම ඩිපෝවක්ම ආවරණය වන පරිදි සියළු ඩිපෝවන් විසින් රැස් කරන ලද දෛනික ආදායමෙන් රු.20,000 සිට රු.30,000 දක්වා වූ මුදලක් පාරිතෝෂික ගෙවීම් සඳහා වූ අරමුදලකට බැර කර රු.916,047,510 ක මුදලක් රැස්කර තිබූ අතර එම අරමුදලින් පාරිතෝෂික ගෙවීම් ලෙස රු.1,114,698,800 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබූ නමුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 (LKAS 19) අනුව සැලසුම් වත්කමට (Plan Assets) අදාළ වත්කමෙහි සාධාරන අගය (FV), වර්ථමාන අගය (PV), වර්තමාන සේවා පිරිවැය (Current Service Cost) හා ආයුසණක ලාභය (Actuarial Gain) ප්‍රතිලාභ සැලැස්මට අනුව හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කර නොතිබුණි. | ශ්‍රී ලං.ග.ම. තුළ පාරිතෝෂිත අරමුදලක් ස්ථාපිත කර නොමැත. කෙසේ නමුත්, 2018 වර්ෂය අවසානය දක්වා විශ්‍රාම ගිය සේවක මහත්ම මහත්මීන්ගේ පාරිතෝෂිත ගෙවීම් පාරිතෝෂිත පනතේ විධි විධාන අනුව, මසක් ඇතුලත ගෙවා නොතිබූ අවස්ථා අති විශාල සංඛ්‍යාවක් වාර්තා වී තිබූ අතර, නියමිත දිනට පාරිතෝෂිත ගෙවීම් සිදුකර තිබුණේ ඉතා අතලොස්සක් පමණි. මේ අනුව අධිභාර ගෙවීම් හා අධිභාර ඉල්ලා පවරනු ලැබූ නඩු කටයුතු ද වැළකී ඇත. | ගිණුම්කරණ ප්‍රමිතයට අනුව සැලසුම් වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර, උපයන පොලිය හා ආයු ගණක ලාභය ගිණුම්ගත කළ යුතුය. |
| (ඕ) | ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 20(2) අනුව රාජ්‍ය ප්‍රදාන විලම්බිත ආදායම් හෝ රාජ්‍ය ප්‍රදාන ලෙස හඳුනාගෙන වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය පදනම් කර ගෙන තර්කානුකූල හා ක්‍රමානුකූල පදනමක් මත ක්‍රමක්ෂය කළ යුතු වුවද බස් රථ 500 ක් මිලදී ගැනීම සඳහා ඉන්දියානු ණය ප්‍රදාන | ගිණුම් වර්ෂයට අදාළව මිලදී ගන්නා ලද බස්රථ වල පිරිවැය විගණන විමසුමේ පෙන්වා ඇති රු.7,875,574,424 නොව ශ්‍රී ලං.ග.ම. විසින් ගිණුම ගත | ගිණුම්කරණ ප්‍රමිතයට අනුව රාජ්‍ය ප්‍රදාන නිවැරදිව හඳුනාගෙන ආයු කාලය |

| | | | |
|---|---|---|---|
| | යටතේ ලද හා දේශීය අරමුදල් ලෙස මහා භාණ්ඩාගාරයෙන් ලද රු.5,513,325,424 ක මුදල විලම්බිත ආදායම් ලෙස හෝ රාජ්‍ය ප්‍රදාන ලෙස ගිණුම්ගත කර මිලදී ගනු ලැබූ වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය වන වසර 08 පදනම් කර ක්‍රමක්ෂය කරන ලද වටිනාකමින් රු.218,260,298 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | කර ඇති රු.5,513,996,941.02 වේ. ඒ බව ප්‍රවාහන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2024/05/17 දිනැතිව හා මගේ අංක NT/04/09/CT/176/Vol – V දරන ලිපියේ පිටපතක් විගණන අධිකාරී වෙත යොමු කර ඇත. | පදනම් කර ගෙන ක්‍රමක්ෂය කළ යුතු ය. |
| (ක) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 (LKAS 36) අනුව අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් මණ්ඩලයට නෛතික බැඳීමක් පවතින්නේ නම්, එම බැඳීම් පියවීම පිණිස මුදල් පිටතට ගලා යාම හව්‍ය බැවින් හා එම බැඳීමේ ප්‍රමාණය ඇස්තමේන්තු කර ඇත්නම්, එම මුදල අසම්භාව්‍ය බැරකමක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මාර්ග අනතුරු හේතුවෙන් වන්දි ලෙස ගෙවිය යුතු රු.2,075,449,378 ක මුදල සමාලෝචිත වර්ෂයේ ගිණුම් ප්‍රකාශ තුළ අසම්භාව්‍ය බැරකමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | වගකීමක අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් තිබීම, එම බැඳීම නිරාකරණය කිරීමේදී ව්‍යාපාරයේ සම්පත් පිටතට ගලා යාම, බැඳීම් පිළිබඳ විශ්වාසනීය ඇස්තමේන්තුවක් කළ හැකිවීම යන පදනම මත හඳුනාගත නොහැකි නිසා මාර්ග අනතුරු හේතුවෙන් ගෙවිය යුතු වන්දි ලෙස රු.2,075,449,378 ක මුදල ගිණුම් ප්‍රකාශ තුළ අසම්භාව්‍ය බැරකම් ලෙස දක්වා නොමැත. | ගිණුම්කරණ ප්‍රමිතයට අනුව අසම්භාව්‍ය වගකීම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඛ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 (LKAS 36) අනුව ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවයන් ඇතුළතට ගලා ඒමක් හව්‍ය වන විටෙක මණ්ඩලය විසින් වාර්තා කරන දිනට තිබූ අසම්භාව්‍ය වත්කම් වල ස්වභාවයෙහි සංක්ෂිප්ත විස්තරයක් හා මූල්‍ය බලපෑමෙහි ඇස්තමේන්තුවක් ගිණුම්වල හෙළිදරව් කළ යුතු වුවත්, දැනට නෛතික කටයුතු ආරම්භකර තිබුණු 2015 වර්ෂයේ ජනාධිපතිවරණයේදී හිටපු ජනාධිපතිවරයාගේ ප්‍රචාරණ රැස්වීම් සඳහා සහභාගී වූ ජනතාව ප්‍රවාහනය කිරීම සඳහා ලබා දුන් ශ්‍රී ලංගම බස් රථ සඳහා ලැබිය යුතු හිඟ මුදල වන රු.142,523,600 ක මුදල සහ 2023 ජුනි 26 දිනැති බේරුම්කරණ නියෝගයට අනුව පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු බැරකම වෙනුවෙන් උසාවියේ තැන්පත් කරන ලද රු.236,569,639 ක මුදල් වත්කම ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි. | ඩිපෝවන් 42 ක් විසින් ජනාධිපතිවරණය සඳහා බස්රථ ලබාදී ඇති අතර එයට අදාළ ගිණුම් කටයුතු එම ඩිපෝවන් විසින් සිදු කර නොමැත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක LKAS 36 යටතේ දක්වා ඇත්තේ අසම්භාව්‍ය බැරකම් නොව අස්පෘශ්‍ය වත්කම් ය. පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු බැරකම් වෙනුවෙන් උසාවියේ තැන්පත් කළ යුතු මුදල 2023 මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිය අනුව මණ්ඩලයට අය විය යුතු මුදල් හා අසම්භාව්‍ය වගකීම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්වල හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ග) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38 (LKAS 38) අනුව පිරිවැය රු.36,426,972 ක් වූ පරිගණක මෘදුකාංග මූලික හඳුනා ගැනීමෙන් පසුව පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ අලාභහානි අඩු කර ගිණුම්ගත කළ යුතු වුවත්, 2020 සැප්තැම්බර් 08 හා 2020 ජනවාරි 13 මිලදීගෙන තිබූ පිළිවෙලින් රු.3,012,277 ක් හා රු.2,321,105 ක් වටිනා ගිණුම්කරණ මෘදුකාංග පද්ධති අපේක්ෂිත ආයු කාලය අනුව ක්‍රමක්ෂය කිරීමකින් තොරව ක්ෂය කර තිබූ බැවින් මෙම මෘදුකාංග දෙකෙහි ක්ෂය වටිනාකම රු.959,661 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර, ඒ හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ දෝෂය සිදු වී ඇත. 2024.01.31 වන දින නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිය අනුව අස්පෘශ්‍ය වත්කම් අපේක්ෂිත ආයු කාලය අනුව ක්‍රමක්ෂය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඝ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38 (LKAS 38) හි 21 වගන්තිය අනුව වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට ඉඩ ඇති බව සහ වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි අවස්ථාවකදී පමණක් අස්පෘශ්‍ය වත්කම් හඳුනාගත යුතු වුවත් ජාතික පෙරගෙවුම් කාඩ්පත් ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ERP මෘදුකාංග පද්ධතියක් මිලදී ගැනීම වෙනුවෙන් 2022 මාර්තු මාසයේදී වෙන් කරන ලද රු.1,500,000 ක වටිනාකම ගෙවා නොතිබුණු නමුත් පරිගණක මෘදුකාංග ගිණුමට ඇතුළත් කර සමාලෝචිත වර්ෂයේදී රු.499,950 කට ක්ෂය කිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි. | අදාළ දෝෂය සිදු වී ඇත. 2024.01.31 වන දින නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුව වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි අවස්ථාවේ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කර ක්ෂය කළ යුතු ය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ ආකෘතිමය රාමුව අනුව වත්කම් හෝ ආදායම් අධික ලෙස ප්‍රකාශ නොකිරීම හා වගකීම් හෝ වියදම් අඩුවෙන් දැක්වීම නොකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අශෝක් ලේලන්ඩ් සමාගමට අයත් අධිසුඛෝපභෝගී බස් රථ අධිවේගී මාර්ගවල ධාවනය හේතුවෙන් උපයාගත් මාර්ග ලේඛන ආදායමෙන් වියදම් ලෙස අඩු කළ රු.647,383,565 ක වියදම, අශෝක් ලේලන්ඩ් සමාගමට ලාභ ලෙස ගෙවූ රු.347,621,164 ක මුදල හා එකී සමාගමට ගෙවිය යුතු රු.40,118,601 ක මුදල වශයෙන් එකතුව රු.1,035,123,330 ක මුදල හා විශේෂ චාරිකා සඳහා මණ්ඩලයේ බස් රථ වෙනුවට ලංකා අශෝක් ලේලන්ඩ් සමාගමේ බස් රථ යොදවා ඉපයූ ආදායමෙන් අශෝක් ලේලන්ඩ් සමාගමට ලාභ | මෙම ක්‍රමවේදය අනුව අදාළ සමාගමේ බස්රථ වලින් ලැබෙන දෛනික ආදායම "කුළී බස්රථ ආදායම් ගිණුම" ට බැර කළ යුතු වන අතර, ඉන්ධන, ප්‍රසාද දීමනා, සේවක වේතන සහ පිවිසුම් ගාස්තු කුළී බස්රථ ආදායම් ගිණුමට හර කළ යුතුය. එම ගිණුමෙහි ශුද්ධ අගය 85% සහ 15% ලෙස බස්රථ හිමිකරු සහ ශ්‍රී ලං.ග.ම. අතර, බෙදා ගනු ලබයි. ශ්‍රී ලං.ග.ම. ට අදාළ 15% ක | සමාලෝචිත වර්ෂයේ ආදායම් වියදම් නිසි පරිදි හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී විචක්ෂණ භාවයෙන් යුතුව කටයුතු කළ යුතු වේ. |

| | |
|---|---|
| වශයෙන් ගෙවූ රු.3,999,228 ක් හා වියදම් වශයෙන් ගෙවූ රු.3,446,420 ක් වශයෙන් වූ එකතුව රු.7,445,648 ක මුදල අවසන් ගිණුම්වල වියදම් හා වගකීම් යටතේ දක්වා නොතිබුණි. | ප්‍රමාණය කුළී බස්රථ ආදායම ලෙස ගිණුම් ගත කර ඇත. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට දේපල, පිරියත හා උපකරණ උපලේඛනය අනුව, බස් රථවල පිරිවැය 15,183,719,274 වුවද, අවසන් ගිණුම්වල එය රු.17,465,573,721 ක් ලෙස දක්වා තිබුණු බැවින් බස් රථවල පිරිවැය රු.2,281,854,447 කින් වැඩියෙන් දක්වා තිබුණි. තවද 2014 ජුලි 25 වන දින මිලදී ගත් පිරිවැය රු.4,816,758 ක් වූ අශෝක් ලේලන්ඩ් ආසන 54 බස් රථයේ වටිනාකම දේපල, පිරියත හා උපකරණ උපලේඛනය තුළ ඇතුළත් කර නොතිබුණු බැවින් දේපල, පිරියත හා උපකරණ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ දෝෂය සිදුවී තිබෙන බව පිළිගනිමි. | වත්කම් ලේඛන අනුව උපලේඛන සකස් කර ඒ අනුව අවසන් ගිණුම් සකස් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉදිරිපත් කර තිබූ දේපල, පිරියත හා උපකරණ උප ලේඛනයේ බස් රථ හැර වත්කම් අයිතම 06 කට අදාළ ශේෂයන් අවසන් ගිණුමේ සඳහන් වත්කම් ශේෂ හා සන්සන්දනය කිරීමේදී දේපල, පිරියත හා උපකරණ වටිනාකම රු.406,356,901 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය අංශය විසින් විගණන අංශය වෙත ලබාදුන් උප ලේඛන සහ අවසන් ගිණුම් අතර, වෙනස ගැළපීම් කළ විට එය රු.406,356,901 ක් වේ. | වත්කම් ලේඛන අනුව උපලේඛන සකස් කර ඒ අනුව අවසන් ගිණුම් සකස් කළ යුතුය. |
| (ඇ) | ඉන්දියානු ණය නියම ගිවිසුම යටතේ ගමනාගමන මණ්ඩලය සඳහා ආසන 32 නව බස් රථ 500 ක් මිලදී ගැනීමට ඉන්දියානු එක්සිම් බැංකුව විසින් වෙන් කර තිබූ ඇමරිකන් ඩොලර් මිලියන 15.03 කින් උපයෝජනය කරන ලද ඇමරිකන් ඩොලර් 13,331,250 කට අදාළ රුපියල් වටිනාකම හා බස් රථ මෙරටට ගෙන්වීම සඳහා දරණ ලද ගුදම් ගාස්තු ඇතුළු බස් රථ වර්තමාන තැනට හා තත්ත්වයට පත් කිරීම දක්වා පිරිවැය වූ රු.5,513,325,424 හා ගිණුම්ගත වටිනාකම වූ රු.5,513,996,941 අතර වෙනස වශයෙන් මුළු වටිනාකම වූ රු.671,517 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ප්‍රාග්ධන වත්කම් ලෙස වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | මෙම බස්රථ 500 සඳහා සියළුම ගෙවීම් සිදුකරන ලද්දේ ප්‍රවාහන අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශය මඟිනි. එබැවින් මෙම වත්කම් ප්‍රාග්ධනිත කිරීම සඳහා එම ගෙවීම් වලට අදාළව තොරතුරු ප්‍රවාහන අමාත්‍යාංශය මඟින් ගෙන්වා ගන්නා ලදී. එකී තොරතුරු මත පදනම්ව අදාළ වත්කම් ගිණුම් ගත කර ඇත. ඒ අනුව මෙම බස්රථ 500 ට අදාළව ගිණුම් ගත කළ වටිනාකම රු.5,513,996,941.02 වේ. | වත්කම් මිලදී ගැනීම සඳහා දරණ ලද පිරිවැය නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දේපල, පිරියත හා උපකරණ උපලේඛනයට අනුව ගොඩනැගිලි සහ බස් රථ සඳහා සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකම පිළිවෙලින් රු.60,479,551 ක් හා රු.878,395,273 ක් වුවද අවසන් ගිණුම් තුළ එය රු.59,791,800 ක් හා රු.874,811,245 ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකම පිළිවෙලින් රු.687,751 ක් හා රු.3,584,028 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය හා දේපල, පිරියත හා උපකරණ ශේෂය එම වටිනාකමින් වැඩි වී තිබුණි. | ශ්‍රී ලං.ග.ම. විසින් මෙතෙක් පවත්වාගෙන එන ලද වත්කම් ලේඛනය 2023 අවසන් ගිණුම් ඉදිරිපත් කිරීම සඳහා එක් එක් ඒකකයට අනුව සකස් කිරීම සිදු කරන ලදී. එසේ ඒකක මට්ටමින් සකස් කරන ලද වත්කම් ලේඛනයේ දත්ත සාරාංශ කිරීමේදී මෙම දෝෂය සිදු වී ඇත. | දේපල, පිරියත හා උපකරණ නිවැරදිව හඳුනාගෙන නිවැරදි ක්ෂය අගය ගිණුම්ගත කළ යුතුය |
| (ඉ) | 2023 වර්ෂයේ යුධ හමුදා සහ ගුවන් හමුදා ගමන් බලපත්‍ර ආදායම් ගිණුමෙහි පෙර වර්ෂයන්ට අදාළව ලද එකතුව රු. 35,361,791 ක මුදලක් ණයගැති ශේෂයට හිලව් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ලැබීම් ලෙස සටහන් කිරීම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණු අතර ඊට අදාළ ණයගැති ශේෂය වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් තැබීමේදී අදාළ දෝෂය සිදුවී ඇත | සමාලෝචිත වර්ෂයට අදාළ බලපත්‍ර ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ඌව ප්‍රාදේශිකයට අයත් තණමල්විල ඩිපෝව විසින් ඉන්ධන මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ලෙස 2023 දෙසැම්බර් 05 දින නිකුත් කරන ලද වටිනාකම රු.2,138,829 බැගින් වූ චෙක්පත් 02 හි වටිනාකම වන රු.4,277,658 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම්වල ණයහිමි ශේෂය තුළ හර ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබූ අතර, අත්තිකාරම් ශේෂය ද අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ දෝෂය සිදු වී ඇත. ඉදිරියේදී මෙවැනි දෝෂ ඇති නොවන ආකාරයට වගකීම් සහගත ලෙස කටයුතු සිදු කරන ලෙස සහකාර මුදල් වෙත ලිඛිත උපදෙස් ලබා දී ඇත. | මිලදී ගැනීම් සඳහා අත්තිකාරම් නිකුත් කිරීම සාවද්‍ය වන අතර, ගෙවා තිබූ අත්තිකාරම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | මහරගම ඩිපෝව විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුමෙහි සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට බැංකු ශේෂ සනාථ අනුව ශේෂය රු.75,684,839 ක් වුවද අවසන් ගිණුම්වල එය රු.79,964,948 ක් ලෙස පෙන්වීම හේතුවෙන් අවසන් ගිණුම් වල පෙන්වා තිබූ මුදල් ශේෂය රු.4,280,109 කින් වැඩියෙන් පෙන්වා තිබුණි. | මෙම දෝෂය 2012 වර්ෂයට පෙර සිට ඉදිරියට පැමිණෙන ශේෂයක් බව මහරගම ඩිපෝව සඳහා පත්කරන ලද නව සහකාර කළමනාකාර (මුදල්) විසින් ප්‍රකාශකර සිටී. | මුදල් ශේෂය අඩුවීටම හේතු සොයා බලා ඊට වගකිව යුත්තන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඌ) | තණමල්විල ඩිපෝව විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යන ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂ සනාථ අනුව අවසන් ශේෂය රු.375,044 ක වාසිදායක ශේෂයක්ව පැවති අතර, සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම්වල එය අවාසිදායක ශේෂයක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් අවසන් ගිණුම්වල නිරූපණය වන ඉතිරි කිරීමේ | අදාළ දෝෂය සිදු වී ඇත. මෙම දෝෂය සිදුවී ඇත්තේ හර කළ යුතු වටිනාකම වන රු.375,044.00 ක මුදල අතපසුවීමකින් බැර කර තිබීමයි. | වෙනසට හේතු සොයා බලා සාවද්‍ය ගිණුම් තැබීම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිණුම් ශේෂය දෙගුණයකින් එනම් රු.750,088 කින් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඵ) | නැගෙනහිර ප්‍රාදේශීය කාර්යාලයේ හා මඩකලපුව ඩිපෝව තුළ පවත්වාගෙන යන බැංකු ගිණුම් ශේෂ 05 ක රු.759,227 ක හර ශේෂය හා රු.4,585,117 ක අයිරා ශේෂය සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම් තුළ ජංගම බැංකු ගිණුම් ශේෂ ලෙස නිරූපණය කළද, එම ශේෂ වැරදි ගිණුම් සටහන් හේතුවෙන් සිදු වූ සාවද්‍ය ශේෂයන් බැවින් අවසන් ගිණුම් වල සත්‍ය මුදල් ශේෂය රු.3,825,890 කින් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ දෝෂය සිදුවී ඇත. නැගෙනහිර ප්‍රාදේශිකයට අයත් බැංකු ගිණුම් 05 ක තොරතුරු 2018 වර්ෂයේදී ගිණුම්කරණ පැකේජයට ඇතුලත් කිරීමේදී මෙම වරද සිදුවී ඇත. දැනට මෙම බැංකු ගිණුම් ක්‍රියාත්මක නොවන අතර මීට අදාළ ගැලපීම් සිදුකර නිවැරදි කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. | සාවද්‍ය මුදල් ශේෂය පිළිබඳ සොයා බලා වගකිව යුත්තන්ට එරෙහිව කටයුතු කළ යුතුය. |
| (ඒ) | බදුල්ල, මහියංගනය, කැප්පෙටිපොල, මූතූර් හා කාත්තන්කුඩි ඩිපෝවල පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම්වල මුදල් ගිණුමට අනුව පැවතිය යුතු අයිරා ශේෂ අවසන් ගිණුම් වල අඩුවෙන් පෙන්වීම හේතුවන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුම්වල පෙන්වා තිබූ එකතු අයිරා ශේෂය රු.14,789,142 කින් අඩුවෙන් දක්වා තිබුණි. | බදුල්ල ඩිපෝව විසින් මෙම දෝෂය සිදු කර ඇති බව පිළිගනිමි. මහියංගනය ඩිපෝව හා කැප්පෙටිපොල ඩිපෝව, කාත්තන්කුඩි ඩිපෝව විසින් මෙම වරද සිදු කර ඇති බව පිළිගනිමි. | අයිරා ශේෂය පිළිබඳව සොයා බලා වගකිව යුත්තන් සම්බන්ධයෙන් පියවර ගත යුතුය. |
| (ඔ) | මන්නාරම ඩිපෝව, මහරගම ඩිපෝව හා මධ්‍යම බස් රථ කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම්වල මුදල් පොතට අනුව පැවතිය යුතු අයිරා ශේෂ අවසන් ගිණුම්වල වැඩියෙන් පෙන්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුම්වල පෙන්වා ඇති අයිරා ශේෂය රු.6,453,619 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මන්නාරම ඩිපෝව විසින් 2024 වර්ෂයේ ජනවාරි මස කරන ලද ගෙවීමක් 2023 දෙසැම්බර් මස මුදල් පොතෙහි සටහන් කිරීම හේතුවෙන් මෙම දෝෂය සිදු වී ඇත. මහරගම ඩිපෝවද ගිණුම් තැබීමේදී මෙම දෝෂය සිදු කර ඇති බව පිළිගනිමි. | අයිරා ශේෂය පිළිබඳව සොයා බලා ඊට වගකිව යුත්තන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඕ) | 2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ උපලේඛනයට අනුව ජංගම ගිණුම් හර ශේෂය රු.566,252,078 ක් වුවද අවසන් ගිණුම්වල එය රු.1,082,572,294 ක් ලෙස පෙන්වා තිබූ බැවින් අවසන් ගිණුම් ශේෂය රු.516,320,216 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ශේෂ පිරික්සුම් අනුව ජංගම ගිණුම් වල ශේෂයන් හා අවසන් ගිණුම් වල ශේෂයන් අතර කිසිදු වෙනසක් නොමැති බව ප්‍රකාශ කරමි. | හර ශේෂ වෙනස පිළිබඳ සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ක) | මණ්ඩලයේ ඩිපෝවන්, ප්‍රාදේශීය කාර්යාල, ප්‍රාදේශීය වැඩපොල හා රියදුරු අභ්‍යාස විද්‍යාල මගින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු සම්බන්ධව අදාළ මූල්‍ය ආයතන විසින් 2023 දෙසැම්බර් 31 දිනට විගණනය සඳහා ලබා දී තිබූ | අදාළ දෝෂය සිදුවී ඇත. අදාළ මහරගම තැනගේ දෝෂයක් නිසා මෙම වරද සිදුවී ඇති අතර අදාළ සහකාර කළමනාකාර | මේ පිළිබඳව පුළුල් විමර්ශනයක් කර වගකිව යුත්තන් ට |

| | | | |
|---|---|---|---|
| | සෘජු ශේෂ සනාථ අනුව 2023 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු ගිණුම් 60 ක රු.740,984,457 ක ශේෂයක් පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසන් ගිණුම්වල එය රු.724,572,282 ක් ලෙස පෙන්වා තිබීම හේතුවෙන් ස්ථාවර තැන්පත් ශේෂය රු.16,412,175 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. මෙම ඌන ශේෂය තුළ මහරගම ඩිපෝව මගින් මහරගම මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන රු.15,000,000 ක ස්ථාවර තැන්පතුවක් ද තිබුණි. | (මුදල්) වෙනත් ඩිපෝවක් වෙත ස්ථාන මාරු කර ඇත. | එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඛ) | මණ්ඩලය සතුව තිබූ රු.740,484,457 ක් වටිනා ස්ථාවර තැන්පතු වලින් තැන්පතු 57 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා උපචිත පොලිය වන රු.34,889,365 ක මුදල උපචිත පොලී ආදායම් ලෙස සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ දෝෂය සිදුවී ඇති බව පිළිගනිමි. | ස්ථාවර තැන්පතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කර උපචිත පොලිය හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ග) | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කර තිබූ 2022 වර්ෂයට අදාළ සන්සන්දනාත්මක ගිණුම් ප්‍රකාශයේ පරිපාලන වියදම් ශේෂය තුළ පාරිතෝෂික ගෙවීම් ලෙස ගිණුම්ගත කර තිබූ රු.937,486,487 ක ශේෂය සමාලෝචිත වර්ෂයේ සන්සන්දනාත්මක මූල්‍ය ප්‍රකාශයේ පරිපාලන වියදම් වල අඩුවෙන් පෙන්වා තිබීම හේතුවෙන් 2023 වර්ෂයේ සමුච්චිත ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | පෙන්වාදී ඇති පරිදි රු.937,486,487 ක මුදල නිසා 2023.12.31 දිනට සමුච්චිත ලාභය අඩුවීමක් සිදුවී නොමැත මක්නිසාද යත් මෙම ගැලපීම සිදුකර ඇත්තේ පාරිතෝෂිත වෙන්කිරීම 2023.12.31 දින සිට නිවැරදි ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව සංශෝධනය කිරීම නිසාය. | ගිණුම් ශේෂ නිවැරදිව හඳුනාගෙන නිවැරදි වැය විෂය යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| (ඝ) | 2022 දෙසැම්බර් 31 දිනට සන්සන්දනාත්මක මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වර්ෂය සඳහා ලාභය ලෙස පෙන්වා තිබූ ශේෂය රු. 484,219,604 ක් වූවද, සන්සන්දනාත්මක විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දක්වා තිබූ ලාභය රු.1,421,706,096 ක් විය. ඒ අනුව සංශෝධිත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ලාභය ලෙස පෙන්වා තිබූ වටිනාකම හා පෙර වර්ෂයේ ලාභය අතර වෙනස වූ රු.937,486,492 ක වටිනාකම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදල් හර ශේෂය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි. | 2022.12.31 දිනට පිළියෙල කරන ලද විස්තීරණ ආදායම් ප්‍රකාශයට අනුව රු.484,219,601 ක ලාභයක් පෙන්නුම් කළ අතර 2023 වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී 2022 වර්ෂයට අදාළව සිදුකරන ලද ගැළපීම් හේතුකොට ගෙන 2022 වර්ෂයේ සත්‍ය ලාභය රු.1,421,706,090 ක් වේ. | සාවද්‍ය ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කර වගකිවයුත්තන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ච) | සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ ආදායමට එරෙහිව හඳුනාගත් වාර්ෂික ක්ෂය ප්‍රමාණය රු.1,025,070,337 ක් වුවද මණ්ඩලය | පෙන්වා ඇති ක්‍ෂය ප්‍රමාණය වන රු.1,025,070,337 ක් වුවද, ඉන් රු.118,464,414 | ක්ෂය වටිනාකම නිවැරදිව මුදල් |

| | | | |
|---|---|---|---|
| | විසින් වක්‍ර ක්‍රමයට සකසා තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ බදු පසු ලාභයට ගලපා තිබූ ක්ෂය ප්‍රමාණය රු.906,605,923 ක් වූයෙන් වාර්ෂික ක්ෂය වියදම රු.118,464,414 ක් අඩුවෙන් ගලපා තිබුණි. | ක වටිනාකම පෙර වර්ෂයට අදාළ වටිනාකමක් වන අතර එය හා රු.906,605,923 ක ප්‍රවර්ථන වර්ෂයට අදාළ ක්‍ෂය වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ක්‍ෂය ලෙස ඇතුළත් කර ඇත. | ප්‍රවාහ ප්‍රකාශය තුළ ගැලපීම් නොකිරීමට හේතු සොයා බලා මුදල් හා මුදල සමාන ශේෂයට වන බලපෑම නිවැරදි කළ යුතුය. |
| (ඡ) | සමාලෝචිත වර්ෂයේදී සිදු කරන ලද පෙර වර්ෂයේ ගැලපීම් වටිනාකම වූ රු.892,145,839 ක ශේෂය සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ බදු පෙර ලාභයට සාවද්‍ය ලෙස ගැලපීම් කර තිබුණු බැවින් මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | අදාළ දෝෂය සිදුවී ඇත. පෙර වර්ෂයට අදාළ ගැලපුම් ගිණුමේ ශේෂය කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ දැක්වීමට කටයුතු කරනු ඇත. | බදු පෙර ලාභයට සාවද්‍ය ගැලපීම් කර ශුද්ධ මුදල් ප්‍රවාහය වෙනස් කිරීමට කටයුතු කිරීම පිළිබඳ පරීක්ෂා කර අදාළ පියවර ගත යුතුය. |
| (ජ) | සමාලෝචිත වර්ෂය තුළදී අමතර කොටස්වල සහ ඉන්ධන තොගයේ අතිරික්ත වටිනාකම වූ රු.6,544,593 ක් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහ යටතේ ගිණුම්ගත කිරීම තුළින් අදාළ කාල පරිච්ඡේදයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් වැඩි වී තිබුණි. | අදාළ දෝෂය සිදුවී ඇත. ඉදිරි වර්ෂ වලදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී මෙම වරද නිවැරදි කිරීම සිදු කරනු ඇත. | අතිරික්ත තොග වටිනාකම නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඣ) | ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් සමාගම විසින් 2019 වර්ෂයේ පවරන ලද බේරුම්කරණ නඩු තීන්දුවට අදාළව දස දෙනෙකුගෙන් යුත් සමීක්ෂණ මණ්ඩලයක් මගින් ඒකල ගබඩාවේ භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර තිබූ අතර, 2019 නොවැම්බර් 04 දින ඉදිරිපත් කර තිබූ සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව එකී සමාගමට අයත් ඒකල ගබඩාවේ තිබූ භාවිතයට ගත නොහැකි හා ප්‍රති අපනයනයට තිබූ තොගවල වටිනාකම ඇමරිකන් ඩොලර් 874,593 ක් විය. එම තොගවල රුපියල් අගය එදිනට තොග අගය කළ ඩොලරයේ වටිනාකම වන රු.181.38 ට අනුව රු.158,633,738 ක් වූ අතර, එම මුදල සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ගැනීමට හෝ හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණන විමසුම මගින් පෙන්වාදී ඇති ඇ.එ.ජ. ඩො 874,593 ක ශේෂය තුල ප්‍රති අපනයනය කළ යුතු භාණ්ඩ වල වටිනාකම වන ඇ.එ.ජ.ඩො 519,984 ක් ඇතුලත්ව ඇත. | තොග ශේෂයන් නිවැරදිව ගිණුම්වල අනාවරණය කළ යුතුය. |
| (ට) | රත්මලාන ඉන්ධන පිරවුම් හලේ දෛනික තොග සහ විකුණුම් වාර්තාවන්ට අනුව 2023 වර්ෂය තුළදී නිකුත් කර තිබූ ඉන්ධන තොග වටිනාකම රු.453,925,605 ක් වූ අතර, සමාලෝචිත | රත්මලාන ඉන්ධන පිරවුම්හල මගින් පවත්වාගෙන යනු ලබන දෛනික විකුණුම් | ඉන්ධන විකුණුම් ආදායම නිවැරදිව |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඉන්ධන විකුණුම් ආදායම ලෙස රු.453,047,652 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.877,953 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ලේඛනයේ මුළු එකතුව සහ ලෙජර් ගිණුම අතර වෙනසක් පවතී. | හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඨ) | විලම්බිත ආදායම් ලෙස හෝ රාජ්‍ය ප්‍රදාන ලෙස ගිණුම්ගත කළ යුතු ඌන විලම්බිත ආදායම හෝ රාජ්‍ය ප්‍රදාන මුදලින් සමාලෝචිත වර්ෂයේ ක්‍රමක්ෂය අඩු කිරීමෙන් පසු ලැබෙන රු.71,261,572 ක ශුද්ධ මුදල සමාලෝචිත වර්ෂයේ විලම්බිත ආදායම හෝ රාජ්‍ය ප්‍රදාන යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | එවැනි දෝෂයක් සිදුවී නොමැත. අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව සිදු කර ඇත. | විලම්බිත ආදායමට අනුව ක්‍රමක්ෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ණ) | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සන්සන්දනාත්මක ප්‍රකාශය තුළ 2022 වර්ෂයේ අවසන් දිනට සමුච්චිත අරමුදල් ශේෂය ලෙස ගිණුම්ගත කළ යුතු රු.24,993,653,069 ක හර ශේෂය සමාලෝචිත වර්ෂයේ ගිණුම් සමඟ ඉදිරිපත් කරන ලද සන්සන්දනාත්මක ප්‍රකාශය තුළ රු.19,115,858,531 ක හර ශේෂයක් ලෙස දක්වා තිබීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ආරම්භක දිනට පෙන්වා ඇති සමුච්චිත අරමුදල් හර ශේෂය රු.5,877,794,538 කින් අඩුවෙන් දක්වා තිබුණි. | පෙන්වාදී ඇති රු.24,993,653,069 වන සමුච්චිත ලාභ ශේෂය 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ තුළ 2022.12.31 දිනට පැවති ශේෂය වේ. 2022 සහ ඊට පෙර වර්ෂ වලට අදාළව 2023 වර්ෂයේදී සිදුකරනු ලබන ගැලපීම් හේතුකොට ගෙන 2023.12.31 දිනට පැවති සමුච්චිත ලාභ අලාභ ගිණුමේ ශේෂය රු.19,115,858,531 ක් විය. | ගිණුම් ශේෂ නිවැරදිව හඳුනාගෙන ඌන හර ශේෂය නිවැරදිව ගිණුම් ගත යුතු ය. |
| (ත) | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සමඟ ඉදිරිපත් කරන ලද 2022 සන්සන්දනාත්මක විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ 2021 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද පාරිතෝෂික වෙන් කිරීම් ලෙස ගිණුම්ගත කර තිබූ රු.500,687,941 ක පාරිතෝෂික අධි වෙන් කිරීම අනෙකුත් විස්තීරණ ආදායම් යටතේ ගිණුම් ගත කර තිබුණි. ඒ හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් එකතුව එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලේ හර ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක (LKAS)19 අනුව පාරිතෝෂිත වෙන් කිරීම සඳහා ගිණුම්කරණ කටයුතු සිදු කර ඇත. ඒ අනුව ඉහත ගිණුම්කරණ ප්‍රමතයේ සඳහන් සමීකරණ (SRn හා MSRn) සමීකරණ භාවිතයෙන් පාරිතෝෂිත අරමුදල සඳහා වෙන්කිරීම් සඳහා ගණනය කිරීම් සිදුකර ඇත. | සාවද්‍ය ගැලපීම් පිළිබඳ සොයා බලා නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ද) | බස් රථ ඇණිය වැඩිදියුණු කිරීම, ආයතනික සංවර්ධනය සහ ධාරිතාව ඉහළ නැංවීමට එන්ජින් කට්ටල මිලදී ගැනීම සඳහා මණ්ඩලයට වැය විෂය අංක 117-2-27-1-2201 මගින් ප්‍රාග්ධන වැය යටතේ රු.මිලියන 2,000 ක් සමාලෝචිත | 2023 වර්ෂයේ මූල්‍ය වාර්තා සකස් කිරීමේදී මෙම දෝෂය සිදුවී ඇත. 2023 වර්ෂය තුළදී ලක්දිව ඉංජිනේරු සමාගම වෙතින් බස්රථ | වාර්ෂික ප්‍රතිපාදන නිවැරදිව කළමනාකරණය කර වැය |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය විසින් වෙන් කර තිබූ අතර, එකී මුදලින් වැය කර තිබූ මුදල රු.916,360,000 ක් වුවද 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ගිණුම්වල එය රු.881,620,000 ක් ලෙස පුනරුත්ථාපන ප්‍රදාන යටතේ ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව රු.34,740,000 ක මුදලක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අළුත්වැඩියා කිරීම වෙනුවෙන් එම ආයතනයට ගෙවීම් කළ රු.34,740,000/- ක මුදල ඍජුව ප්‍රවාහන අමාත්‍යංශය මඟින් ලබා ගෙන ඇත. | කරන ලද මුදල් නිවැරදිව ගිණුගත කළ යුතුය. |
| (ධ) | ඇමරිකානු ඩොලර් මිලියන 318 ක ණය මාලාවේ ශේෂව තිබූ අරමුදල් මගින් ශ්‍රී ලංගමය සඳහා බස් රථ 600 ක් මිලදී ගැනීමේ කාර්යය සඳහා වැය ශිර්ෂ අංක 117-2-27-3-2101-0/17 යටතේ දේශීය වියදම් ප්‍රතිපූරණය සඳහා භාණ්ඩාගාරය මගින් වෙන් කර තිබූ රු.මිලියන 770 න් සමාලෝචිත වර්ෂය සඳහා වැය කර ඇති රු.690,774,614 ක මුදලින් බස් රථ මිලදී ගැනීම සඳහා රාජ්‍ය ප්‍රදාන ලෙස ගිණුම් කර තිබූ මුදල රු.470,905,380 කි. මේ අනුව රු.219,869,234 ක් රාජ්‍ය ප්‍රදාන අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | රු.මිලියන 777 ක මුදල සහ සමාලෝචිත වර්ෂය තුළදී වියදම් කර ඇති රු.690,774,614.00 ක මුදල පිළිබඳව හා පෙන්වා දී ඇති රු.470,509,380.00 ක මුදලින් නිරූපනය වන්නේ බස්රථ 500 මිලදී ගැනීම සඳහා ශ්‍රී ලං.ග.ම. වෙත ලැබුණු රාජ්‍ය ප්‍රදානයට අදාළව 2023 වර්ෂයේදී ක්‍රමක්ෂය කරනු ලබන වටිනාකමයි. | වාර්ෂික ප්‍රතිපාදන නිවැරදිව කළමණාකරණය කර වැය කරන ලද මුදල් නිවැරදිව ක්‍රමක්ෂය කර ගිණුම්ගත කළ යුතුය. |
| (න) | සමාලෝචිත වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය මගින් පාසල් හා උසස් අධ්‍යාපන වාර ප්‍රවේශ පත්‍ර ප්‍රතිපූර්ණය සඳහා මණ්ඩලය වෙත වෙන්කර තිබූ මුදල් ප්‍රතිපාදන වලින් ලැබී තිබූ රු.මිලියන 270 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මෙහි සඳහන් කර ඇති රු.මි.270 ක මුදල ශ්‍රී ලං.ග.ම. වෙත නොලැබුණ අතර මහා භාණ්ඩාගාරය උපදෙස් මත විසින් බස්රථ 500 ක් මිලදී ගැනීම සඳහා අවශ්‍ය දේශීය වියදම් පියවා ගැනීමට අදාළ වැය ශීර්ෂය වෙත මාරු කරන ලදී. | රජයෙන් ලැබෙන ප්‍රතිපාදන නිවැරදිව අදාළ වැය විෂය යටතේ ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ක්‍රියාත්මක නොවූ ගිණුම් | 1,290,782,782 | ශේෂ තහවුරු කිරීම සඳහා විස්තරාත්මක උපලේඛන | මෙම විගණන විමසුමේ දක්වා ඇති ශේෂයන් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලේඛන ඉදිරි විගණන වලදී ලබාදීමට කටයුතු කරනු ඇත. | අදාළ ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ) | ලංකා අශෝක් ලේලන්ඩ් ආයතනයේ කොටස් සඳහා | 23,406,250 | කොටස් සහතික හා වෙළඳපොල | මෙම විගණන විමසුමේ දක්වා ඇති ශේෂයන් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලේඛන ඉදිරි | අදාළ ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබීමට |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ආයෝජන | | වටිනාකම් ගණනය කිරීම පිළිබඳ විස්තර | විගණන වලදී ලබාදීමට කටයුතු කරනු ඇත. | අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ඇ) | සේවක කොටස් ප්‍රාග්ධනය | 190,302,122 | කොටස් සහතික හා හිමිකම් පිළිබඳ උපලේඛන | මෙම විගණන විමසුමේ දක්වා ඇති ශේෂයන් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලේඛන ඉදිරි විගණන වලදී ලබාදීමට කටයුතු කරනු ඇත. | අදාළ ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ඈ) | මාර්ගස්ථ මුදල් | 51,291,031 | විස්තරාත්මක උප ලේඛණ හා ශේෂ සනාථ ලිපි | මෙම විගණන විමසුමේ දක්වා ඇති ශේෂයන් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලේඛන ඉදිරි විගණන වලදී ලබාදීමට කටයුතු කරනු ඇත. | අදාළ ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

### 1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉන්දියානු ණය ප්‍රදාන යටතේ මිලදී ගන්නා ලද බස් රථවල දෛනික ආදායමෙන් රු.5,500 ක මුදලක් දෛනිකව ප්‍රාදේශීය කාර්යාල හරහා ප්‍රධාන කාර්යාලයේ ගිණුමකට මාරු කර අරමුදලක් ස්ථාපනය කර තිබූ අතර, ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම අරමුදල රු.443,065,080 කින් වර්ධනය කර ගෙන තිබූ අතර, මෙය අවසන් ගිණුම්වල වෙනම හෙළිදරව් කර නොතිබුණි. | 2023 වර්ෂයේදී ඉන්දියානු ණය ආධාර යටතේ බස්රථ 500 ක් ශ්‍රී ලං.ග.ම. වෙත ලබා දෙන ලදී. මේ සඳහා ගෙවීම් මහා භාණ්ඩාගාරය මඟින් කරනු ලබන අතර මහා භාණ්ඩාගාරය සමග සාමූහික අභිලාෂ ප්‍රකාශය සම්බන්ධ සාකච්ඡාවකදී ලබා දුන් උපදෙස් අනුව මෙම අරමුදල රැස් කර ඇත. | අරමුදල් ස්ථාපනය විධිමත් විය යුතු අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල හා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු වේ. |

### 1.5.6 මෙහෙයුම් නොවන ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ අවසන් ගිණුම්වල සංචිත යටතේ පෙන්වා තිබූ වර්ෂ ගණනාවක සිට මෙහෙයුම් කටයුතු සිදු නොවන රු.6,221,004 ක වටිනාකමින් යුත් රක්ෂණ සංචිත, කම්කරු වන්දි සංචිත, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් හා ගමන් ප්‍රවේශපත් අරමුදල වශයෙන් ශේෂයන් 04 ක් පැවතුණි. | එකඟ වේ. මෙම ශේෂයන් මූල්‍ය වාර්තාවල අතීතයේ සිට පැවත එන ශේෂයන් වේ. | මෙම ශේෂයන් නිවැරදිව හඳුනාගෙන ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.5.7 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්වල ප්‍රසාද දීමනා සඳහා වෙන් කිරීම් කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ ගිණුම්වල සංශෝධිත සන්සන්දනාත්මක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි 2022 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් ශේෂය තුළ ප්‍රසාද දීමනා සඳහා වෙන් කිරීමක් ලෙස රු.82,500,000 ක මුදලක් පෙන්වා තිබුණි. | 2022.12.31 දිනට ප්‍රසාද දීමනා වෙන් කිරීම 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වගකීම් යටතේ 2022 සංශෝධිත වටිනාකම ලෙස නිරූපනය කර ඇත. | ප්‍රසාද දීමනා ගෙවීම අරමුණු කර කරන ලද ගැළපීමක් නිසා ඒ පිළිබඳ පරීක්ෂා කර බලා අදාළ පියවර ගත යුතු වේ. |
| (ආ) | බස් රථ නිෂ්පාදනයට අදාළව 2020 අංක 03 දරණ මුදල් කොට්ඨාශ චක්‍රලේඛය මගින් යෝජනා කර තිබූ දිරි දීමනා ක්‍රමය තුළ කොටස් වශයෙන් නිශ්පාදනය කරන අමතර කොටස් සඳහා දිරි දීමනා ගෙවීම සිදු කළද සම්පූර්ණයෙන්ම බස් රථයක බොඩි කොටස නිෂ්පාදනය කරන කාලවකවානුවද නිශ්චය කරන ලද දිරි දීමනා ඇගයීම් ක්‍රමයක් හා මාසිකව නිෂ්පාදනය කළ යුතු අනිවාර්යය සීමා, දිරි දීමනා සීමා චක්‍රලේඛය මගින් දක්වා නොතිබියදී, සමාලෝචිත වර්ෂය තුළ දිරි දීමනා වශයෙන් රු.19,247,995 ක් ගෙවා තිබුණි | 2020 අංක 03 චක්‍ර ලේඛය මඟින් යෝජනා කර තිබූ දිරි දීමනා ක්‍රමය තුළ බස් රථයක බොඩි නිෂ්පාදනය ආරම්භ කිරීමේ සිට අවසන් කිරීම දක්වා කාල වකවානු නියම කර ඇති අතර, ඩිපෝ වෙත භාරදීම දක්වා කාල වකවානු නියම කර නොමැත. | දිරි දීමනා සීමා චක්‍රලේඛය නිෂ්පාදනය පදනම් කර සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයට අයත් මධ්‍යම බස් රථ නැවතුම්පලේ ඇති වර්ග අඩි 8,228 ක වපසරියකින් යුත් ගොඩනැගිල්ලක් වාර්ෂිකව ගිවිසුම් අළුත් කිරීමකින් තොරව හා විධිමත් තක්සේරුවකින් තොරව බදු දී තිබීම හේතුවෙන් 2013 සැප්තැම්බර් 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු හිඟ මුදල වන රු.4,000,000 හා 2017 ජනවාරි 01 දින සිට 2023 පෙබරවාරි 08 දින දක්වා ලැබිය යුතු රු.26,560,560 ක හිඟ මුදල වශයෙන් වූ එකතුව රු.30,560,560 ක් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | අදාළ දෝෂය සිදුවී ඇත. මේ පිළිබඳ පරීක්ෂා කර බලා නිවැරදි කිරීම් සිදු කරනු ඇත. | අය විය යුතු කුළී ආදායම නිවැරදිව හඳුනා ගෙන ආදායමට ගත යුතුය. |
| (ආ) | සිසු සැරිය, නිසි සැරිය හා ගැමි සැරිය ධාවන කටයුතු වෙනුවෙන් ප්‍රතිපූර්ණය සඳහා රජය විසින් ගෙවනු ලබන මුදල් ජාතික ගමනාගමන කොමිෂන් සභාවට මණ්ඩලය විසින් ඉදිරිපත් | සිසුසැරිය සහ නිසිසැරියට අදාළ මුදල් ගමනාගමන කොමිෂන් සභාව මගින් ලබා ගැනීම සඳහා ඩිපෝ | ලැබිය යුතු මුදල් නිවැරදිව හඳුනාගෙන |

| | | | |
|---|---|---|---|
| | කරනු ලබන බිල්පත්වලට අනුව ගෙවීම් කළ යුතු වුවත්, ගමනාගමන කොමිෂන් සභාව විසින් බස් රථ ධාවනය සඳහා ප්‍රාදේශීය කාර්යාල වෙත (රුහුණු ප්‍රාදේශීය කාර්යාලය හැර) 2023 වර්ෂය සඳහා ගෙවිය යුතු හිඟ ශේෂයන් වූ පිළිවෙලින් රු.135,429,430 ක්, රු.11,716,992 ක් හා රු.112,949 ක් වශයෙන් එකතුව රු.147,259,371 ක මුදල 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ අවසන් ගිණුම්වල ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | මඟින් ඉදිරිපත් කරනු ලබන වාර්තා ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගෙවීම් කිරීමේදී ඉල්ලුම් කරනු ලබන මුදල සහ ගෙවනු ලබන මුදල් අතර වෙනසක් පවතී. | ආදායමට ගත යුතුය. |
| (ඇ) | කොවිඩ් කාල වකවානුව තුළදී ප්‍රාදේශික 09 ක රෝහල් කාර්යය මණ්ඩලය ප්‍රවාහනය සඳහා 2020 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මණ්ඩලයේ බස් රථ යොදවා තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට රු.151,585,764 ක මුදලක් අය විය යුතුව තිබුණි. අදාළ සේවාව සපයා අවුරුදු 02 ක් ගත වී තිබුණ ද මෙම මුදල නිසි කාලයේදී අය කර ගැනීමට මණ්ඩලය අපොහොසත්වී තිබුණි. | මධ්‍යම රජයේ රෝහල් සහ පළාත් සභා රෝහල් සඳහා ශ්‍රී ලං.ග.ම. විසින් ලබාදී ඇති බස් රථ වෙනුවෙන් තවදුරටත් ලැබිය යුතු ආදායම අයකර ගැනීම සඳහා සෞඛ්‍යය අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත ලිඛිතව දැනුම් දී ඇත. | කාර්ය මණ්ඩල ප්‍රවාහන ගාස්තු කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ලැබිය යුතු කොන්දොස්තර හිඟ මුදල් ශේෂය ලෙස ගිණුම්ගත කර තිබූ රු.6,168,805 ක ශේෂය තුළ වසර ගණනාවක සිට හිඟව පවතින රු.4,753,550 ක මුදලක් පවතින අතර, එම මුදලෙහි සේවය හැරගිය සහ විදේශගත පුද්ගලයින්ගෙන් ආපසු අය කර ගත නොහැකි වූ රු.328,242 ක මුදලක් හා රත්මලාන ඩිපෝවෙහි විස්තර සොයාගත නොහැකි වූ රු.6,363 ක ශේෂයක් පැවතුණි. | අදාළ ශේෂයන් දිගින් දිගටම මූල්‍ය වාර්තා වල පෙන්නුම් කරන බව පිළිගනිමි. මෙහි සඳහන් මුදල් වලට අදාළ කොන්දොස්තර මහතුන් බොහෝමයක් සේවය අතහැර ගොස්, මිය ගොස් සහ නොදන්වා විදේශ ගතව ඇති බැවින් මෙම මුදල් අයකර ගැනීමට නොහැකි වී ඇත. | පරීක්ෂා කර බලා හිඟ ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු හමුදා කුලී ආදායම ලෙස ගිණුම්ගත කර තිබූ රු.70,658,623 ක ශේෂය තුළ වර්ෂ 05 ට වඩා පැරණි රු.64,907,313 ක ශේෂයක් තිබූ අතර, දීර්ඝ කාලයක සිට පොත්වල පෙන්නුම් කරන මෙම ආදායම් ශේෂය අයකර ගැනීමට හෝ ඒ සඳහා හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කර නොතිබුණි. | හමුදා කුළී ගමන් සඳහා බස්රථ වෙනුවෙන් ලැබිය යුතු මුදල් වලට අදාළ ඉන්වොයිස් සකස් කර අදාළ ආයතන වෙත යොමු කරනු ලබන අතර, ගිණුම් තැබීමේ කටයුතු ප්‍රධාන කාර්යාලයේ සිදු කරනු ලබයි. | වර්ෂ 05 ට වඩා පැරණි ශේෂ නිවැරදිව හඳුනා ගෙන ආපසු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂය වූ රු.91,281,307 ක වටිනාකම තුළ වසර 10 කට වඩා පැරණි රු.25,431,648 ක ශේෂයක් ද, වසර 05 ත් 10 ත් | මෙම ශේෂයන් මූල්‍ය වාර්තා තුළ අතීතයේ සිට පැවත එන ශේෂයන් වේ. මේවා සනාථ කරගැනීම සඳහා කිසිදු | ලැබිය යුතු කල් ගත වූ ශේෂ නිවැරදිව |

| | | | |
|---|---|---|---|
| | අතර වූ රු.48,493,282 ක ශේෂයක්ද හා වසර 02 ත් 05 ත් අතර රු.2,550,136 ක ශේෂයක්ද, ණයගැති වයස් විශ්ලේෂණය හඳුනා නොගත් රු.10,092,048 ක ශේෂයන් ද පැවතුණි. එම ලැබිය යුතු ශේෂයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී හානිකරන අලාභ සඳහා ප්‍රතිපාදනයන් කිරීමට කටයුතු කර නොතිබුණි. | හැකියාවක් නොමැති අතර , අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදෙස් පරිදි මෙම ශේෂයන් පිළිබඳව ගත යුතු ඉදිරි පියවරයන් සම්බන්ධව නිර්දේශ ලබාදීම සඳහා අභ්‍යන්තර විගණන අංශය වෙත අවශ්‍ය තොරතුරු ලබාදී ඇත. | හඳුනාගෙන අය කර ගැනීම හෝ ඒ සඳහා හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ඇතුළත් වෙළඳ ණයහිමි ශේෂය තුළ ප්‍රාදේශීය කාර්යාල 02 ක් සහ ඩිපෝ 19 ක් විසින් ප්‍රධාන ටයර් සැපයුම්කරුවෙකුට හා අමතර කොටස් සැපයුම්කරුවන් දෙදෙනෙකු සඳහා ගෙවිය යුතු වසර 05 කට වඩා පැරණි රු.382,156,975 ක නොපියවූ ණය ශේෂය සාවද්‍ය ගිණුම් සටහනක් බව නිරීක්ෂණය වන බැවින්, ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් වර්ෂ ගණනාවක සිට දිගින් දිගටම පැවත එන ශේෂයන් වන අතර මෙකී ශේෂ ගිණුම්කරණ වැරදි සහ දෝෂ නිසා පැන නැඟී ඇත. | ණය හිමි ශේෂ සඳහා ශේෂ සනාථ ලබා ගෙන ශේෂ නිවැරදිව හඳුනාගෙන ආදායමට ගැනීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම් තුළ ජංගම වගකීම් යටතේ ඇතුළත් කර තිබූ රු.2,712,682,543 ක ගෙවිය යුතු ශේෂය තුළ සේවක වැටුපෙන් අඩු කර තෙවන පාර්ශවයන් වන සමිති සමාගම් හා මූල්‍ය ආයතන ඇතුළු ආයතන 05 ක් සඳහා ගෙවි යුතු වසර දෙකකට වඩා වැඩි රු.109,516,143 ක් හා ගිණුම් 27 කට අදාළ වසර දෙකක් ඉක්මවූ රු.2,603,166,400 ක ණයහිමි ශේෂයක් පවතින අතර, එය සාවද්‍ය ගිණුම් සටහනක් බව නිරීක්ෂණය වන බැවින් ආදායමට බැර කිරීමට කටයුතු කර නොමැති අතර, මෙම ශේෂයන්ගෙන් රු.1,078,029,266 ක් වසර 10 ක් ඉක්මවූ ණය ශේෂ විය. | මෙම ශේෂයන් මූල්‍ය වාර්තා තුළ අතීතයේ සිට පැවත එන ශේෂයන් වේ. 2005 සිට 2017 දක්වා කාලය තුළ ශ්‍රී ලං.ග.ම. තුල පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් සැපයුම්කරුවන්ට ගෙවීම් කිරිමේදි ඩිපෝ මට්ටමින් ගෙවීම් කිරීමට නොහැකි වූ අවස්ථාවන්හිදි සැපයුම් දාමය අඛණ්ඩව පවත්වා ගැනිම සඳහා අදාළ වවුචර් පත් ප්‍රධාන කාර්යාලයට ගෙන්වා ගෙන ගෙවීම් කර ඇත. | මෙම ශේෂයන් සත්‍ය වශයෙන්ම ගෙවිය යුතු ශේෂයක් ද යන්න තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථ ලබා ගෙන ගිණුම් කරණ දෝෂ යක් නම් ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වෙළඳ හා අනෙකුත් ණයගැතියන් යටතේ පෙන්වා ඇති රු.91,281,308 ක ශේෂය තුළ කොළඹ ප්‍රාදේශීය කාර්යාලයේ, කැස්බෑව ඩිපෝවේ, මධ්‍යම බස් රථ කාර්යාලයේ හා මීතොටමුල්ල ඩිපෝවේ අය කර ගත යුතු පාර්ශවය නිශ්චිතව හඳුනා නොගත් පිළිවෙලින් රු.721,611 ක්, රු.27,762 ක්, රු.17,399,614 ක් හා රු.165,270 ක් වශයෙන් වූ එකතු වටිනාකම රු.18,314,257ක් ද ඩිපෝ මගින් වෙනත් ඩිපෝ වලට ලබා දී තිබූ ණය මුදල් වලින් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර තිබූ රු.28,810,742 ක් ද මාතලේ ප්‍රාදේශීය වැඩපොලට ආරක්ෂක අමාත්‍යාංශය මගින් ලැබිය යුතු රු.499,166 ක මුදලක් සහ ඩිපෝවන් තුනක උපයන විට ගෙවීමේ බදු ලෙස වූ රු.327,283 ක ශේෂයක් ද නිරීක්ෂණය වූ අතර එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙහි සඳහන් කර ඇති කොළඹ ප්‍රාදේශීය කාර්යාලයට අයත් රු.721,611/- ක මුදලත්, කැස්බෑව ඩිපෝවට අයත් රු.27,762/- ක මුදලත්, මීතොටමුල්ල ඩිපෝවට අයත්, රු.165,270/- ක මුදලත් මධ්‍යම බස්රථ කාර්යාලයේ ලෙස සඳහන්ව ඇති රු.17,399,614/- ක මුදලද දීර්ඝ කාලීන වශයෙන් පැවත එන ශේෂයන් වන අතර, මෙම ලැබිය යුතු ශේෂයන් සම්බන්ධ කිසිදු පාර්ශවයක් හෝ ලේඛනයක් සොයා ගැනීමට හැකියාවක් නොමැත. | හඳුනා ගත නොහැකි ශේෂ නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතු අතර, හානිකරන අලාභ සඳහා ප්‍රතිපාදන වෙන් කළ යුතු අතර, හඳුනාගත් ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂය තුළ ඇතුළත් ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් 21 කට අදාළ රු.1,611,808,399 ක් ණයහිමි ශේෂ හා ගිණුම් 04 කට අදාළ රු.126,777,337 ක උපචිත වියදම් වශයෙන් වූ එකතුව රු.1,738,585,736 ක් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. | මෙම වටිනාකම තුළ දීර්ග කාලයක් තිස්සේ දිගින් දිගටම පැවත එන ශේෂයන් කිහිපයක් පවතින අතර, ඊට අමතරව තෙවන පාර්ශව ගෙවීම් ලෙස වැටුපෙන් අය කර ඇති ශේෂ ඇත. | මෙම ගිණුම් ශේෂ නිවැරදිව හඳුනාගෙන හා ශේෂ සනාථ ගෙන ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - | | | |
| i. | මුදල් රෙගුලාසි 105 | අලාභ හානි සම්බන්ධව අය කර ගත හැකි උපරිම අගය හා අය කර ගත යුතු මුදල තීරණය කළ | විගණනය විසින් පෙන්වා දී ඇති අලාභානි අගය රු.12,136,724 ක් නිවැරැදි වේ. මෙම අලාභය මේ වන | අලාභ හානි අය කර ගැනීමට කඩිනමින් |

| | | | | |
|---|---|---|---|---|
| | | යුතු වුවත් පිරිවැය රු.1,041,195 ක් වටිනා හානි වූ මෝටර් වාහන සම්බන්ධයෙන් යථෝක්ත මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොමැති අතර, 2022 මැයි 09 දින සිදුවූ කලබලකාරී සිද්ධියේදී හානියට පත් බස් රථ හා වාහන වටිනාකම වූ රු.12,136,724 ක මුදල සම්බන්ධයෙන් ද මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | තෙක් අයකර ගැනීමට නොහැකිවී ඇත්තේ එම කටයුත්තට අදාළව සිදුවන විමර්ශණ කටයුත්ත තවමත් අවසන් කර නොමැති බැවිනි. | කටයුතු කළ යුතුය. |
| ii. | මුදල් රෙගුලාසි 177 | රාජ්‍ය ආදායමේ කොටසක් වශයෙන් හෝ නොඑසේ නම් තම තමන්ට ලැබෙන මුළු මුදලම දිනපතා හෝ හැකිතාක් කලින් හෝ ප්‍රේෂණය කොට එම මුදලට කුවිතාන්සි ලබා ගැනීම රජය වෙනුවෙන් කවර මුදලක් වුවද ලබන සියළු එකතු කරන නිලධාරීන්ගේ රාජකාරිය වුවද පරීක්ෂාවට භාජනය කළ 2023 මැයි මාසයේදී කටුබැද්ද අධිසුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවය මගින් බස් රථ වලින් එකතු කරන ලද රු.4,257,900 ක වටිනාකමින් යුත් බස් රථවල දෛනික ආදායම් දින 1-3 කට වඩා ප්‍රමාද වී බැංකුගත කර තිබුණි. | 2023.05.01 දින සිට 2023.05.31 දින දක්වා ලද මාර්ග ලේඛන ආදායම විමසුමෙහි සඳහන් කර ඇති මුදල හා සැසඳේ. සෑම දිනකම ලැබෙන ආදායම නිසි පරිදි බැංකු ගත කිරීමට කටයුතු කර ඇති අතර, එසේ දිනක් හෝ දින දෙකක් බස්රථ කිහිපයක ආදායම බැංකු ගත කිරීමේ ප්‍රමාදය පිළිගනිමි. | ලැබෙන ආදායම දෛනිකව ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය. |
| iii. | මුදල් රෙගුලාසි 208 (ඇ) | නිසි ගණන්දීමේ නිලධාරියාගේ පූර්ව අනුමැතියකින් තොරව, වාර්ෂික විසර්ජන පනත හරහා වෙන් කර තිබූ ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහා පමණක්ම යෙදවිය | විගණන විමසුමෙහි පෙන්වා දී ඇති පරිදි ජාතික අයවැයෙන් කොටස් හිමියන් සඳහා වන්දි මුදල් ගෙවීමට ලබාදුන් මුදල ලෙස ලබාදී ඇති රු.8,981,180/- ක මුදල වෙනත් කාර්යයක් සඳහා | රජයේ ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහා පමණක් යෙදවීමට වගබලා ගත |

| | | | | |
|---|---|---|---|---|
| | | යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ බස් රථ පුනරුත්ථාපනය සඳහා ලබා දුන් රු.34,740,000 ක මුදල විධිමත් අනුමැතියකින් තොරව වෙනත් කාර්යයන් සඳහා යොදවා තිබුණි. | යොදවා නොමැත. | යුතුය. |
| iv. | මුදල් රෙගුලාසි 387 | චෙක්පත් මගින් කෙරෙන සියලුම ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත්දැයි ගෙවන නිලධාරියා විසින් නිතරම සොයා බැලිය යුතු අතර, කිසිම ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා ලබා ගැනීම තහනම් වුවත්, මණ්ඩලය විසින් 2023 දෙසැම්බර් 31 දිනට රු.548,969,542 ක අයිරාවක් පවත්වාගෙන තිබූ අතර, ඒ සඳහා අයිරා පොලිය ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු.907,131 ක මුදලක් ගෙවා තිබුණි. | විගණන විමසුමෙහි පෙන්වා දී ඇති පරිදි 2023.12.31 දිනට රු.548,969,542/- ක මුදල මුදල් පොතට අනුව අයිරාව වේ. එලෙස අයිරාවක් පැන නැඟීමට හේතුවක් වනුයේ බවුසරයක් සඳහා ගෙවනු ලබන චෙක්පතෙහි වටිනාකම රු.මි.2.5 කට ආසන්න වීමත්, පසු දින ආදායමින් එම චෙක්පතෙහි වටිනාකම ආවරණය කරගැනීමේ අපේක්ෂාවෙන් ඉන්ධන ලබාගැනීමත් නිසාය. | රෙගුලාසි වලට අනුගතව අයිරා පවත්වා ගෙන යාමට හැකි පමණ උත්සහා ගත යුතුය. |
| v. | මුදල් රෙගුලාසි 395 (ඇ) | බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේදී දී ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වන දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුතු වුවත් හර ශේෂ වටිනාකම රු.525,443,654 ක් වූ ජංගම ගිණුම් 10 ක සහ රු.9,794,929 ක අයිරා ශේෂ සහිත ජංගම ගිණුමක බැංකු සැසඳුම් ප්‍රකාශ විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ලැයිස්තුවේ සඳහන් ගිණුම් 02 ක් ඉතිරි කිරීමේ ගිණුම් වන අතර, එම ගිණුම් සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. | යාවත්කාලීන ව බැංකු සැසඳුම් සකස් කර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| vi. | මුදල් රෙගුලාසි 395 (ඇ) | 2023 දෙසැම්බර් මස සකසන ලද බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.19,247,645 කට අදාළ ඩිපෝ 05 ක හා ඉන්ධන පිරවුම් හල් දෙකක මුදල් නොවූ චෙක්පත් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන් ඉදිරිපත් කිරීමේදී මෙම තොරතුරු ඇතුළත් කරන ලෙස සියළු ඒකකයන් දැනුවත් කර ඇත. | මුදල් නොවූ චෙක්පත් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කළ යුතු ය. |
| vii. | මුදල් රෙගුලාසි 395 (ඉ) | 2023 දෙසැම්බර් මාසය වෙනුවෙන් සකසන ලද බැංකු සැසඳුම් ප්‍රකාශ සමඟ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතු නමුත් රු.4,050,546 ක වටිනාකමකින් යුතු ඩිපෝ 03 ක සහ රත්මලාන ඉන්ධන පිරවුම් හලෙහි තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන් ඉදිරිපත් කිරීමේදී මෙම තොරතුරු ඇතුළත් කරන ලෙස සියළු ඒකකයන් දැනුවත් කර ඇත. | තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් පිළිබඳ විස්තර ඉදිරිපත් කළ යුතු ය. |
| viii. | මුදල් රෙගුලාසි 396 (අ) (i) හා (iii) | 2023 දෙසැම්බර් 31 දින වන විට වලංගු කාලය මාස 06 ක් ඉක්මවූ වටිනාකම රු.2,363,351 ක් වූ ඩිපෝ 07ක ගෙවීම් සඳහා ඉදිරිපත් කළ චෙක්පත් 79 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලං.ග.ම. ඒකකයන්හි මාස 06 ඉක්මවූ චෙක්පත් පිළිබඳ විස්තර සොයාබලා අදාළ පාර්ශවයන් වෙත ලිඛිතව දැනුම්දී ඇති අතර, එම චෙක්පත් සඳහා මුදල් කරගැනීමක් හෝ නැවත නිකුත් කරන ලෙස ඉල්ලීම් කර නොමැති බැවින් එකී චෙක්පත් අවලංගු කිරීමට කටයුතු කර ඇත. | වලංගු කාලය මාස 06 ඉක්මවූ චෙක්පත් ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| ix. | මුදල් රෙගුලාසි 450 | ස්වකීය පාලනය යටතේ ඇති සෑම වැඩසටහනක් සම්බන්ධයෙන් පසුගිය මාසය සඳහා වූ වැය භාරය පිළිබඳ මාසික ප්‍රකාශයක් 170 වැනි භාණ්ඩාගාර ආකෘති පත්‍රයෙහි සකස් කොට | ජාතික අයවැය මඟින් බස්රථ පුනරුත්ථාපනය සඳහා වෙන් කරන ලද මුදල් ශ්‍රී ලං.ග.ම. වෙත මුදා හරිනු ලබන්නේ අදාළ බස්රථ පුනරුත්ථාපනය කළ පසු එම වියදම් වාර්තා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කාර්මික) | ප්‍රතිපාදිත සෑම මුදලකටම අදාළ වැය පිළිබඳ මාසික ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | | එක් එක් මාසයේ 10 වැනි දිනට පෙර සෑම ගණන්දීමේ නිලධාරියෙකු විසින් ස්වකීය ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2023 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා ලබා දී තිබූ රු.මිලියන 2,000 ක ප්‍රතිපාදනය උපයෝගී කර වැය කරන ලද රු.916,360,000 ක වැය පිළිබඳව මාසික ප්‍රකාශයක් සකස්කර ඉදිරිපත් කර නොතිබුණි. | විසින් සහතික කර අභ්‍යන්තර විගණක විසින් තහවුරු කර අමාත්‍යාංශ ලේකම් මඟින් මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීමෙන් පසුය. | |
| x. | මුදල් රෙගුලාසි 486 | තලංගම ඩිපෝව මගින් අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම වෙත 2023 වර්ෂය තුළදී ඉන්ධන ලබා දීම වෙනුවෙන් එම සමාගම විසින් ලබා දී තිබූ රු.1,511,560 ක වටිනාකමින් යුත් අංක 144266 හා අංක 144253 දරණ චෙක්පත් දෙක අගරු වී තිබූ බව නිරීක්ෂණය වූ අතර, ඒ පිළිබඳව මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණයට යටත්ව මූල්‍ය බැඳීම් හා වගකීම් ශ්‍රී ලං.ග.ම. විසින් දැරිය යුතු බැවින් ඒ අනුව මෙම අයකිරීම ශ්‍රී ලං.ග.ම. වෙතම පැවරී ඇත. කෙසේ නමුත් විගණන විමසුම මඟින් පෙන්වා දී ඇති රු.1,511,560/- ක මුදල අගරු වීම සම්බන්ධව සහකාර කළමනාකාර මුදල් වෙතින් නිදහසට කරුණු විමසා ඇත. | අගරු චෙක්පත් සම්බන්ව මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු ය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXV වැනි පරිච්ඡේදයේ 6.1 හා 6.3 වගන්ති | රජයේ පිළිගත් එක් වෘත්තීය සමිති සම්මේලනයක් වෙනුවෙන් නිලධාරීන් දෙදෙනෙකු පූර්ණ කාලීනව සම්මේලනයේ කටයුතු සඳහා නිදහස් කළ හැකි අතර, එසේ මුදා හරිනු ලබන නිලධාරියෙකුට දිවයිනේ ඕනෑම ස්ථානයකට ගමන් කිරීම සඳහා නිදහස් දුම්රිය බලපත්‍ර සහ මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ නිදහස් | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වෘත්තීය සමිති කටයුතු ආයතන සංග්‍රහයේ විධි විධානයන්ට අනුව ක්‍රියාත්මකවී නොමැත. ශ්‍රී ලං.ග.ම. මඟින් පිළිගත් වෘත්තීය සමිති සඳහා දුම්රිය නිදහස් අවසර පත් ලබාදීම ක්‍රියාත්මකවී නොමැත. වර්ෂ ගණනාවක සිට ශ්‍රී ලං.ග.ම. මඟින් පිළිගත් වෘත්තීය සමිති සඳහා දුම්රිය නිදහස් අවසරපත් ලබාදීම සිදුකර ඇත. | අවිධිමත්ව නිකුත් කළ අවසර පත් ආපසු ලබා ගැනීම හෝ පාඩු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රවේශ පත්‍ර ලබා දිය යුතු වුවත්, ඊට පටහැනිව මණ්ඩලය තුළ ක්‍රියාත්මකවන වෘත්තීය සමිති 08 ක් වෙනුවෙන් 2023 වර්ෂය සඳහා දිවයින පුරා ගමන් කළ හැකි විවෘත නිදහස් ගමන් අවසරපත් 138 ක් නිකුත් කර තිබූ අතර, ඒ තුළින් මණ්ඩලයට සිදුව ඇති පාඩුව රු.43,046,993 ක් විය. එසේම හුවමාරු පදනම මත දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් දුම්රිය නිදහස් ගමන් අවසරපත් 22 ක් වෘත්තීය සමිති සඳහා ලබා දීම තුළින් රජයට සිදු වූ පාඩුව රු.25,294,500 ක් වී තිබුණි. | | |
| (ඇ) 1983 අංක 12 දරන පාරිතෝෂික පනත | පනතේ විධිවිධාන අනුව සේවයෙන් ඉවත්වූ සේවකයන් හට ඔවුනට හිමි පාරිතෝෂික මුදල ඉවත් වූ දිනයේ සිට මාසයක් ඇතුළත ගෙවිය යුතු වුවද මීතොටමුල්ල ඩිපෝවේ සේවකයන් හට ඉවත් වූ දිනයේ සිට මාසයක් ඇතුළත පාරිතෝෂික ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන් 2023 සැප්තැම්බර් 11 විගණිත දින වන විට පාරිතෝෂික අධිභාර වශයෙන් රු.459,729 ක මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. | මෙම සේවක මහතා 2017.10.21 වන දින විශ්‍රාම ගොස් සිටි අතර ඔහුට 2018.07.09 හා 2019.01.17 යන දින වාර දෙකකදී පාරිතෝෂිත ගෙවා ඇත. දැඩි මූලාා අර්බුදයක් හේතුව මත පාරිතෝෂික මුදල් මාසයක් ඇතුලත ගෙවා ගැනීමට නොහැකි වී ඇත. | පාරිතෝෂික අධිභාර ගෙවූ පුද්ගලයින්ගෙන් අය කර ගත යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට නිරන්තරයෙන් මෙහෙයුම් කටයුතු සඳහා උපයෝජනය නොවන රු.මිලියන 10 ඉක්මවූ බැංකු ජංගම ගිණුම් 09 ක රු.156,294,791 ක ශේෂයක් පවතින බව නිරීක්ෂණය වූ අතර, කිසිදු පොලී ආදායමක් උපයා නොගෙන එම මුදල් ජංගම ගිණුම්වල රඳවා තබා ගෙන තිබුණි. | මෙම විගණන විමසුම මඟින් පෙන්වා දී ඇති ගිණුම් 11 සැළකීමේදී රු.මි.511 ක ශේෂයක් සහිත ඉතිරි කිරීමේ ගිණුමක්ද රු.මි.336 ක ශේෂයක් පවතින ගිණුමද මූලා වෙළෙඳපළ ගිණුමේ දෛනිකව ආයෝජනය වන අතර ඒ සඳහා පොලී ආදායමක් ලැබී ඇත. | ජංගම ගිණුම් ශේෂ ඵලදායි ආයෝජනයක යෙදවීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂ සනාථ අනුව මණ්ඩලයේ ඩිපෝවන් සහ ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීම් ගිණුම් 24 ක රු. මිලියන 10 කට වැඩි ශේෂය ලෙස රු.2,554,915,542 ක මුදලක් පවත්වගෙන ගොස් තිබුණි. නමුත් එම මුදල ස්ථාවර තැන්පතුවල හෝ ආයෝජනය කර ඉහළ පොලී ආදායමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙහි සඳහන් ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම වෙළෙඳපළ ආයෝජන ගිණුමක් වන අතර, එම ගිණුම වෙත ශ්‍රී ලං.ග.ම. සියළුම ඒකක වල පවතින සියළුම ජංගම ගිණුම් වල මුදල් දෛනිකව මෙම ගිණුමට ප්‍රේෂණය වේ. | අවශ්‍යා ප්‍රමාණයට ගිණුම්වල මුදල් රඳවා ගෙන ඉතිරි මුදල් ඵලදායී ලෙස ආයෝජනය කළ යුතුය. |
| (ඇ) | අධිවේගී මාර්ගයේ ධාවනය කිරීම සඳහා නව බස් රථයක් මිලට ගැනීම වෙනුවෙන් අත්තිකාරම් මුදල ලෙස රු.5,000,000 ක මුදලක් 2022 දෙසැම්බර් 01 දින තංගල්ල ඩිපෝව විසින් රුහුණ ප්‍රාදේශීය කාර්යාලයේ ගිණුම් අංක 013100291922111 වෙත බැර කර තිබුණ ද 2023 දෙසැම්බර් 31 දින දක්වා නව බස් රථය හෝ ලබා ගත් මුදල අදාළ ඩිපෝව වෙත ආපසු ලබා දීමට ප්‍රාදේශීය කාර්යාලය මගින් කටයුතු කර නොතිබුණි. | තංගල්ල ඩිපෝව වෙත බස් රථයක් ලබා ගැනීම සඳහා ගත් මුදල 2022 වර්ෂයේදී අවුරුදු 60 සම්පූර්ණ කර ඇති සියළුම දෙනා විශ්‍රාම යැවීමට කටයුතු කරන ලෙස රජය මඟින් දැනුවත් කිරීමත් සමග ඔවුන්ගේ පාරිතෝෂිත මුදල් ගෙවීමට රුහුණු ප්‍රාදේශිකය වෙත ලබා දීමට කටයුතු කරන ලදී. | නව බස් රථයක් මිලදී ගැනීමට හෝ අත්තිකාරම් මුදල ගෙවීමට කටයුතු කළ යුතු ය. |

## 1.9 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයට රු.93,129,750 ක වටිනාකමින් යුත් නිදහස් දුම්රිය ගමන් අවසර පත් 81 ක් ලබා දී තිබූ අතර, එම දුම්රිය නිදහස් අවසරපත් පුද්ගල නමකට නිකුත් කර තිබේ නම් හෝ එය රාජකාරි අවශ්‍යතාවය සඳහා නිකුත් කර රාජකාරි නිමාවෙන් පසු ආපසු භාරදී නොමැති අවස්ථාවන්හි එය භාරගත් පුද්ගලයා යථෝක්ත චක්‍රලේඛයට අනුව බද්දට යටත් වේ. එම දුම්රිය නිදහස් අවසර පතෙහි වටිනාකමේ මාසික අගය වන රු.95,813 ක වටිනාකම අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනයේදී සේවා නියුක්ති ප්‍රතිලාභ ලෙස ප්‍රමාණනය කර අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද මණ්ඩලය විසින් මෙම අවසරපත් අවිධිමත් ලෙස හා වාර්තා තබා ගැනීමකින් තොරව බෙදා හැර තිබුණු බැවින් එම අවසරපත් අයථා පරිහරණයටද යොමුවී තිබුණි. | හුවමාරු පදනම යටතේ දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් දුම්රිය නිදහස් අවසරපත් 81 ප්‍රධාන කාර්යාලයේ අංශවල පිළිගත් වෘත්තීය සමිති වෙත නිකුත් කර ඇත.මෙම සියලුම ගමන් බලපත්‍ර අදාළ අංශවල වෘත්තීය සමිති නමට පමණක් නිකුත් කර ඇති අතර කුමන අවස්ථාවකදී හෝ දුම්රිය නිදහස් ගමන් අවසරපත් පුද්ගල නමකට නිකුත් කිරීමක් සිදු නොවේ. | චක්‍රලේඛය ප්‍රකාර සේවා නියුක්ති ප්‍රතිලාභ ගණනය කර ආදායම් බද්ද අය කර ගත යුතු ය. |
| (ආ) | පුද්ගල ආදායම් බද්ද සඳහා සේවා නියුක්තිකයෙකුගේ සේවා නියුක්තිය මගින් වන ලැබීම් සහ ලාභ ගණනය කිරීමේදී එකී සේවා නියුක්තිකයා විසින් ලැබූ හෝ උපයන ලද ප්‍රතිලාභ ලෙස ඇතුළත් කළ යුතු මුදල් ප්‍රමාණනය කිරීමේදී දුරකතන දීමනා සහ පෞද්ගලික පරිහරණය සඳහා ලබා දී ඇති නිදහස් ගමන් අවසරපත්වල වටිනාකම ඇතුළත්ව ගණනය කළ යුතු වුවත් මණ්ඩලයේ කාර්යය මණ්ඩලය සඳහා ආදායම් බද්දට යටත් ඉපයීම් නිවැරදිව ගණනය කර බදු වටිනාකම ගණනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.835,621 ක මුදලක් ආදායම් බදු ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. | ශ්‍රී ලං.ග.ම. සේවකයින් සඳහා රාජකාරි කටයුතු සඳහා වාර්තා කිරීමට මෙම ගමන් බලපත්‍ර ලබාදී ඇත. තවද මෙම පහසුකම සේවකයින් සඳහා අතීතයේ සිටම ලබාදී ඇති අතර එය නිදහස් ගමන් බලපත්‍රයක් මෙන්ම සේවා ස්ථානයේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා වන හැඳුනුම්පතක්ද වේ. | හිඟ ආදායම් බද්ද කඩිනමින් අය කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතුය. |

## 1.10 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කටුබැද්ද අධිසුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවයේ බස් රථ සඳහා එක් බස් රථයක CCTV කැමරා 04 ක් Fuel Senser with GPS Based Tracking Unit සහ වෙනම සර්වර් පරිගණකයක් සහිත දෙවන අන්තය (Backend) යෙදවුම් පද්ධතියකින් සමන්විත, අධි සුඛෝපභෝගී බස් රථ සඳහා Supply, Installation and | අදාළ ආයතනය සමඟ ශ්‍රී ලං.ග.ම. අත්සන් කළ ගිවිසුම අනුව මෙම උපකරණ සඳහා ගෙවීම් කළ අතර, | මූලික ශක්‍යතා අධ්‍යයනයක් හරහා අවශ්‍යතා නිසි පරිදි හඳුනාගෙන නිරන්තර අධ්‍යයන මගින් නිවැරදිව ප්‍රසම්පාදන |

| | | |
|---|---|---|
| Commissioning of GPS Tracking and Vedios Surveillance Solution 125 ක් සවි කිරීම සඳහා වූ ටෙන්ඩරය 2018 ජුනි 25 දින M/S ATSL International (Pvt) Ltd වෙත රු.33,628,840 කට පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාර අදාළ කොන්දේසි සම්පූර්ණ කර නොමැති තත්ත්වයක් තුළ අදාළ සැපයුම්කරු වෙත 2018 ඔක්තෝබර් 25 දින සිට 2020 දෙසැම්බර් 09 දින දක්වා චෙක්පත් 07 කින් රු.33,306,894 ක් ගෙවා තිබුණි. මෙම ටෙන්ඩරය ආරම්භයේ සිට ක්‍රියාත්මක කිරීම අවසන් වන තෙක් මණ්ඩලය විසින් ගෙන තිබූ වැරදි කළමනාකරණ තීරණ, අවශ්‍ය Server පද්ධතිය හා පරිගණක සහිත මෙහෙයුම් ස්ථානයක් ස්ථාපනය නොකිරීම, අවශ්‍ය අන්තර්ජාල පහසුකම් ලබා නොදීම හා පද්ධති ස්ථාපනයට අවශ්‍ය අධිසුඛෝපභෝගී බස් රථ ප්‍රමාණය සැපයීමට මණ්ඩලය අසමත් වීම යන කරුණු මත ව්‍යාපෘතිය අසාර්ථක වී තිබූ අතර වසර 03 ක වගකීම් කාලය තුළ හා ගිවිසුම් ප්‍රකාර කොන්ත්‍රාත්කරුගෙන් ගිවිසුම කඩවීමට අදාළ හානිපූර්ණයට තිබූ අවස්ථාව පවා අහිමි වී තිබුණි. වර්තමානය වන විට මෙම බස් රථවල අදාළ උපකරණ කට්ටල හා අංගෝපාංග පවා අස්ථානගතවී තිබූ අතර, කිසිදු මෙහෙයුම් කටයුත්තක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වුයෙන් මෙම ප්‍රසම්පාදනයෙන් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබූ අතර මූල්‍යමය වශයෙන් මණ්ඩලයට රු.33,306,894 ක පාඩුවක් සිදුව තිබුණි. | මෙම සැපයුම්කරු සඳහා මුදල් ගෙවීමේදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) විසින් අදාළ උපකරණ නිසි ලෙස සවිකර ඇති බවටත්, එම උපකරණ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින බවටත් ලබාදුන් සහතික කිරීම මත මෙම උපකරණ වලට අදාළව සැපයුම්කරු සඳහා ගෙවීම් සිදුකර ඇත. මීට අමතරව මෙම ගෙවීම්වලට අදාළ අවසන් වාරික ගෙවීම සඳහා වෙනම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගැනිමෙන් පසුව සිදුකර ඇත. | කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතු අතර, සිදු වූ පාඩුව ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,098,934,63 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.1,922,737,782 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.823,803,152 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම වැඩි වූ ප්‍රතිශතයට වඩා මෙහෙයුම් වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන අදායම් හා වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර වැඩිවීම්වල හා අඩුවීම්වල ප්‍රතිශතයන් පහත දැක්වේ.

| ආදායම/වියදම | වර්ෂය ( 2023) (රු.මි.) | වර්ෂය (2022) (රු.මි.) | වැඩිවීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| මාර්ග ලේඛන ආදායම | 56,861 | 54,957 | 3.46 |
| අනෙකුත් ආදායම් | 15,300 | 11,393 | 34.29 |
| බස් රථ මෙහෙයුම් වියදම | 18,610 | 18,060 | 3.05 |
| ඉන්දන සහ ලිහිසි තෙල් | 41,464 | 37,344 | 11.30 |
| අනෙකුත් පිරිවැය | 9,723 | 6,790 | 43.20 |

2.2.1 සමාලෝචිත වර්ෂයේ මාර්ග ලේඛන ආදායම වර්ධනය සියයට 3 ක පමණ සුළු ප්‍රතිශතයක් බව නිරීක්ෂණය විය. අනෙකුත් ආදායම් සාපේක්ෂව සියයට 34 කින් ඉහළ ගොස් තිබූ අතර, ප්‍රවාහන ගාස්තු ඉහළ යාම තුළ සහනදායී පදනම මත වාර ප්‍රවේශ පත්‍ර හරහා ප්‍රවාහන පහසුකම් ලබා ගන්නා පිරිසගේ ප්‍රමාණය වැඩි වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2.2 බස් රථ මෙහෙයුම් වියදමද ආදායමට සාපේක්ෂව සියයට 3 කින් ඉහළ ගොස් තිබූ අතර, වියදමට සාපේක්ෂව ආදායමේ වැඩිවීමක් සිදුව ඇති බව නිරීක්ෂණය නොවුණි.

2.2.3 ඉන්දන හා ලිහිසි තෙල්වල මිල ඉහළ යාමත්, විධිමත් අභ්‍යන්තර පාලනයකින් යුතුව ඉන්දන බෙදා හැරීම හා පරිභෝජනය සිදු නොවීමත් ඉන්දන හා ලිහිසි තෙල් වියදම සියයට 1 කින් ඉහළ යාමට ප්‍රධාන හේතුව වී තිබුණි.

2.2.4 අනෙකුත් සෘජු පිරිවැය සියයට 43 කින් වැඩි වී තිබූ අතර, ඩොලරයේ අගයට සාපේක්ෂව අමතර කොටස්වල මිල ඉහළ යාම හා විධිමත් පාලනයකින් තොරව අමතර කොටස් මිලදී ගැනීම එයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂයේ මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශවල දත්තවලට අනුරූප ප්‍රධාන අනුපාත පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අනුපාතය | 2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය | 2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය |
|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාතය | 1.52% | 0.73% |
| ශුද්ධ ලාභ අනුපාතය (ප්‍රදාන හා සහනාධාර වලට පෙර) | 2.83% | (0.24%) |
| ජංගම වත්කම් අනුපාතය | 1.24:1 | 1.34:1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 0.94:1 | 1.03:1 |

ජංගම වත්කම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය අනුව ජංගම වත්කම් වලට වඩා ජංගම බැරකම් වැඩි වී ඇති බව නිරීක්ෂණය විය. ජංගම බැරකම් වැඩි වීමට ප්‍රධාන හේතුව බැරකම් ශේෂවල හඳුනා නොගත් ශේෂ හා සාවද්‍ය ගිණුම් සටහන් පැවතීම බව පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහනුවර ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ අනාර්ථික මාර්ග ලෙස මාර්ග 46 ක් හඳුනාගෙන තිබූ අතර, එම මාර්ගවල බස් රථ එක බැගින් ධාවනයට යෙදවීම සඳහා නියමිත ලේඛනගත කිලෝමීටර් ප්‍රමාණය කිලෝමීටර් 7,111.1 කි. එම මාර්ගවල දෛනිකව ධාවනය කරන ධාවන කිලෝමීටර් ප්‍රමාණය 6,690.1 ක් වන අතර, එම ධාවන කිලෝමීටර් ප්‍රමාණය අනුව ගණනය කරන ලද අනාර්ථික කිලෝමීටර් ප්‍රමාණය කිලෝමීටර් 3,243.2 කි. මේ අනුව ගණනය කරන ලද අනාර්ථික ධාවන කිලෝමීටර් 3,243.2 තුළින් දෛනිකව අහිමිවන ආදායම රු.5,804,679 ක් විය. මෙම බස් රථ ධාවනයේදී සැලකිය යුතු අවම නිර්ණායකයන් සැලකිල්ලට භාජනය කර මෙම සේවා වලින් සිදු වන ආදායම් ඌනතාවය යථාවත් කිරීමට හා මහජන සේවාවක් පවත්වාගෙන යාමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | මහනුවර ප්‍රාදේශිකය තුළ පවත්නා අනාර්ථික මාර්ග ලෙස සැළකෙන මාර්ගයන් ඉතා දුෂ්කර තත්ත්වයේ පවති. එබැවින් එම මාර්ගයන්හි බස්රථ ධාවනය කිරීමේදී එම බස්රථ නිරන්තරයෙන් ආපදා තත්ත්වයන්ට ලක්වේ. නමුත් එකී බස්රථ වෙනුවෙන් වෙනත් බස් රථයක් යෙදවීමට ඩිපෝවන්ට නොහැකි බැවින් අනාර්ථික මාර්ගයන්හි ධාවනය කළ යුතු සම්පූර්ණ කිලෝමීටර් ප්‍රමාණයම ධාවනය කිරීමට නොහැකි වීම හේතුවෙන් ඇතැම් දිනයන්හි ආදායම් අහිමි වේ. | අවම නිර්ණායක සැලකිල්ලට ගෙන මෙම සේවා වලින් සිදුවන ආදායම් ඌනතාවය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු වියදම් ශේෂය වූ රු.517,859,913 ක ශේෂය තුළ 2018 වර්ෂයේ සිට පැවත එන බදුල්ල ඩිපෝවෙහි රු.288,246,841 ක පාරිතෝෂික සඳහා වෙන් කිරීමේ ශේෂයක් පැවති අතර, පාරිතෝෂික ගෙවීම් යාවත්කාලීනව සිදුවන තත්ත්වයක් තුළ මෙම වෙන් කිරීම් ශේෂය සාවද්‍ය ගිණුම් ශේෂයක් බව නිරීක්ෂණය විය. මෙම ශේෂය පිළිබඳ පසු විපරම් කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් මූල්‍ය වාර්තා තුළ අතීතයේ සිට පැවත එන ශේෂයන් වේ. 2005 සිට 2017 දක්වා කාලය තුළ ශ්‍රී ලං.ග.ම. තුල පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීමේදි ඩිපෝ මට්ටමින් ගෙවීම් කිරිමට නොහැකි වූ අවස්ථාවන්හිදි සැපයුම් දාමය අඛණ්ඩව පවත්වා ගැනිම සඳහා අදාළ වවුචර් පත් ප්‍රධාන කාර්යාලයට ගෙන්වා ගෙන ගෙවීම් කර ඇත. | මෙම ශේෂයන් සත්‍ය වශයෙන්ම ගෙවිය යුතු ශේෂයක් ද යන්න තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථ ලබා ගැනීමට හෝ ගිණුම් කරණ දෝෂ යක් නම් කපා හැරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් ඩිපෝවල භාවිතා කරන GPRS ටිකට් යන්ත්‍ර සඳහා භාවිතා කරන තාපන (Thermal) කඩදාසි ටිකට් රෝල් මිලදී ගැනීම සඳහා මාස 03 ක අවශ්‍යතාවය පාදක කර ජාතික තරඟකාරී ලංසුකරණ පරිපාටිය යටතේ මිලදී ගැනීමට ප්‍රසම්පාදනය කර තිබූ අතර, මිලදී ගන්නා ටිකට් රෝල් ප්‍රාදේශීය කාර්යාල හරහා මිලදී ගෙන ඩිපෝවන් වෙත බෙදා දෙන ලෙස ප්‍රසම්පාදන කමිටුව විසින් නියෝග කර තිබුණි. එම උපදෙස් වලට පටහැනිව ඩිපෝ 24 ක් මගින් රු.17,534,900 ක වටිනාකමින් යුත් ටිකට් රෝල් 161,110 ක් සෘජුව මිලදී ගැනීම හා ටිකට් රෝලක වෙළඳපොල මිල වූ රු.75 මිල සංශෝධනයකින් තොරව රු.108.84 ක මිලකට අදාළ සැපයුම්කරුගෙන් ටිකට් රෝල් 364,400 ක් මිලදී ගැනීම වෙනුවෙන් එකකට රු. 19.64 ක් බැගින් රු.7,156,816 ක් වැඩියෙන් ගෙවා තිබීම, නැවත මිල සංශෝධනයකින් තොරව අදාළ සැපයුම්කරු සමඟ පූර්ව එකඟ වූ මිලටම ටිකට් රෝල් 603,180 ක් මිලදී ගැනීම තුළ මණ්ඩලයට රු.11,846,455 ක අලාභයක් සිදුව තිබීමත්, ටිකට් රෝල් 1,000,000 ක් මිලදී ගැනීම සඳහා කැඳවූ ලංසු අනුව ඉදිරිපත් වී තිබූ ලංසු මිල වන රු.49.65 කට ටිකට් රෝල් 603,180 ක මිලදී නොගෙන පූර්ව ලංසුකරුගෙන්ම රු.108.84 කට මිලදී ගැනීම තුළ මණ්ඩලයට රු.35,702,224 ක පාඩුවක් සිදු ව තිබීමත් හේතුවෙන් මණ්ඩලයට සමස්ථයක් ලෙස එකතුව රු.42,859,040 ක මූල්‍යමය පාඩුවක් සිදුව තිබුණි. එමෙන්ම මුල් සැපයුම්කරු විසින් සපයන ලද ටිකට් රෝල් කඩදාසිවල පළල, රෝලක විෂ්කම්භය හා රෝලක තිබිය යුතු තත්ත්ව බර විචලනය වී තිබූ අතර, ප්‍රවේශපත්‍ර කඩදාසිවල කාබන් ඇතුරුම් පෘෂ්ඨය ප්‍රමාණවත් නොවීම තුළ ප්‍රවේශ පත්‍ර පැහැදිලිව මුද්‍රණය වී ද නොතිබුණි. | සියළුම ප්‍රාදේශිකයන් සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) තැන විසින් බෙදා වෙන්කර ඇති ටිකට් රෝල් ප්‍රමාණයන් සම්බන්ධයෙන් ප්‍රාදේශිකයන් දැනුවත් කර ඇත. විගණනය විසින් පෙන්වාදී ඇති පරිදි අනුමත නොකළ සැපයුම්කරුවන්ගෙන් ටිකට් රෝල් මිලදී ගෙන ඇත්නම් ඒ පිළිබඳව සොයාබලා අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ප්‍රසම්පාදන මාර්ගෝප දේශ අනුව මිලදී ගැනීම් සිදු කළ යුතු අතර, ප්‍රසම්පාදන මාර්ගෝප දේශවලට පටහැනි මෙවැනි ක්‍රියා වැලැක්වීමට හා සිදු වූ පාඩු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂය සඳහා අවශ්‍ය සිලින්ඩර මුද්‍රන් මිලදී ගැනීම සඳහා මිල කැඳවීම් සිදු කර තිබූ අතර, එක් ලංසුකරුවකු විසින් පමණක් ලංසු තැබීම හේතුවෙන් එම ලංසුව ඇගයීම් කර සාරානුකූල ලංසුකරු ලෙස ඔහු විසින් ඉදිරිපත් කරන ලද රු.139,328,000 ක ලංසුව | පිරිනැමීමේ ලිපිය ලබා දීමට ප්‍රථම මෙම 2.5% ක සමාජ ආරක්ෂණ දායකත්වය ලබාදෙන ලෙස ලංකා අශෝක් ලේලන්ඩ් පුද්ගලික සමාගම ඉල්ලීමක් ඉදිරිපත් | මිල ගණන් කැඳවීමේදී අදාළ බදු සඳහා වගකීම සමාගම |

| | | | |
|---|---|---|---|
| | පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කර තිබුණි. ලංසුකරුගේ ඉල්ලීමකින් තොරව සමාජ ආරක්ෂණ බද්ද ලෙස රු.7,308,500 ක මුදල ලංසු වටිනාකමට ඇතුළත් කිරීමට ටෙන්ඩර් කමිටුවේ ලේකම්ගේ නිර්දේශ මත ටෙන්ඩර් මණ්ඩලය කටයුතු කිරීම, ප්‍රසම්පාදන කටයුතු 2022 මාර්තු 09 දින ආරම්භ කර 2023 ජුනි 06 දින නිම කළ යුතු වීමත්, එකී ප්‍රසම්පාදනය 2023 ඔක්තෝබර් 18 දින පිරිනැමීම, මුල් ගිවිසුමේ 04 වන වගන්තියෙහි දෙවන ඡේදය වෙනස් කර ප්‍රමාද ගාස්තු අය කිරීමට තිබූ කොන්දේසි වෙනස් කිරීම, භාණ්ඩ සැපයීම අවසන් කළ යුතු කාලය 2023 දෙසැම්බර් 15 දින දක්වා දීර්ඝ කිරීම, 2023 දෙසැම්බර් 15 දින වන විට ගිවිසුම ප්‍රකාර සැපයුම්කරු විසින් සැපයිය යුතු සිලින්ඩර මුදුන් 204 ක ප්‍රමාණය සැපයීමට අසමත් වීම හේතුවෙන් ප්‍රසම්පාදන අරමුණ ඉටුවී නොතිබූ අතර සපයන ලද සිලින්ඩර පෙට්ටි (බඳන්) 176 න් සිලින්ඩර් පෙට්ටි 22 ක් ප්‍රතික්ෂේප වීම තුළ මෙම ප්‍රසම්පාදනය හේතුවෙන් මණ්ඩලයට රු.14,215,725 ක මූල්‍යමය අලාභයක් සිදුව තිබුණි. | කර ඇත. මෙම සමාජ ආරක්ෂණ දායකත්වයට අනුමැතිය ලබා දී ඇත්තේ 2022-76 වන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙන් ලබාදී ඇත. | විසින් හෙළිදරව් කළ යුතු අතර, ටෙන්ඩර් මණ්ඩලය ඒ සඳහා මැදිහත් නොවිය යුතුය. |
| (ඇ) | මණ්ඩලයේ රථ ඇණිය සඳහා අවශ්‍ය ටයර් නැවත පිරවීම් සහ පෙරසවි කිරීම සඳහා 2017 වර්ෂයෙන් පසු 2022 වර්ෂය දක්වා ප්‍රසම්පාදනයක් සිදු කිරීමකින් තොරව 2017 වර්ෂයේ තෝරාගත් සැපයුම්කරුවන්ගෙන් අඛණ්ඩව නැවත පිරවීම් හා පෙරසවි කිරීම් සිදු කර ගෙන තිබූ අතර, මිල උච්චාවචනය පාදක කර ඉදිරිපත්කර තිබූ තොරතුරු අනුව 2022 ජූලි මස 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මිල ගණන් ද සංශෝධනය කර එකී සැපයුම්කරුවන්ගෙන්ම මිලදී ගැනීමට අනුමැතිය ලබාගෙන තිබුණි. 2023 වර්ෂය සඳහා අවශ්‍ය මුළු ටයර් ප්‍රමාණය මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන සලසා තිබියදී 2023 වර්ෂය සඳහා මාස 04 ක ටයර් අවශ්‍යතාවය පෙන්වා නැවත පිරවූ ටයර් 8,840 ක් හා පෙරසවි ටයර් 34,856 ක් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවා තිබූ අතර, ඉදිරිපත් වූ ලංසුකරුවන් 17 දෙනෙකුගෙන් ලංසුකරුවන් 14 දෙනෙකු සාරානුකූල ලංසුකරුවන් ලෙස තෝරාගෙන තිබුණි. කෙසේ වෙතත් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලබා දී තිබූ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කිරීමකින් තොරව ලංසු කැඳවීමට පෙර සලකා | අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 19/3139/123/084-I අනුව 2019.11.11 දින පැවති රැස්වීම් තීරණයට අනුව නව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් වන තෙක් ශ්‍රී ලං.ග.ම. ටයර් නැවත පිරවීම සහ පෙරසවි කිරීමේ සේවාවන් වර්තමාන සැපයුම්කරුවන් වෙතින් මිලදී ගැනීමට අනුමැතිය හිමිවී ඇත. මේ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉදිරිපත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව 2022.07.06 දින පැවති අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කිරීමෙන් පසු එම කමිටුව විසින් ඒ සඳහා අනුමැතිය ලබා නොදුන් බව සහ නව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන ලෙස දන්වමින් ප්‍රවාහන | නිවැරදිව හා පූර්ව අධ්‍යනයකින් යුතුව ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කළ යුතු අතර, ආයතනයට උපරිම වාසි ගෙන එන ලෙස ලංසුකරුවන් තෝරා ඔවුන්ට ටෙන්ඩර් පිරිනැමිය යුතු වේ. එමෙන්ම ටෙන්ඩර් ප්‍රමාද කර පූර්ව සැපයුම්කරුවන්ට වාසි |

| | | | |
|---|---|---|---|
| | බැලිය යුතු කරුණු හා සාධක සලකා බැලීමට යටත්ව අනුමැතිය ලබා දීම කල් දමා තිබුණි. මේ හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට නැවත පිරවූ ටයර් හා ටයර් පෙරසවි කිරීම සඳහා ටෙන්ඩරය පිරිනමා නොතිබීම හා ඉහත කී අමාත්‍ය මණ්ඩලය තීරණය කළ මිලට මිලදී ගැනීම හේතුවෙන් මණ්ඩලයට රු.2,841,249,937 ක මුදලක් ගෙවීමට සිදුව තිබූ අතර, ඒ හේතුවෙන් රු.356,007,991 ක මූල්‍යමය පාඩුවක් සිදුව තිබුණි. | අමාත්‍යාංශයේ ලේකම් තැන දැනුවත් කර ඇත. | ලැබෙන පරිදි කටයුතු කළ ටෙන්ඩර් මණ්ඩලයට එරෙහිව ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | 2023 සැප්තැම්බර් 13 වන දින මොරටුව ඩිපෝවේ මුදල් ශේෂය භෞතිකව පරීක්ෂා කළ අතර, එදිනට පැවති මුදල් ශේෂය තුළ රු.54,179 ක මුදල් ඌනතාවයක් අනාවරණය විය. මෙම ඌනතාවය දෛනිකව පවත්වාගෙන යන ඌනතාවයක් බව නිරීක්ෂණය වූ අතර, ඒ පිළිබඳ සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | විගණන විමසුමේ පෙන්වා දී ඇති පරිදි 2023.09.13 දින පරීක්‍ෂණයේදී හෙළිවූ ඌනතාව පිළිගනී. | හිඟ මුදල අය කර ගැනීමට හා වගකිව යුත්තන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ බස් රථ සඳහා වැය කර ඇති ඉන්ධන වියදම රු.40,415,452,419 ක් විය. ශ්‍රී ලංගම රථ ඇණියට අළුතින් එක් කළ බස් රථ 500 ට අමතරව අනෙක් සියළුම බස් රථ වසර 05 කට වඩා වයසින් වැඩි බස් රථ වන අතර, මෙම බස් රථ වල ඉන්ධන පොම්පවල පවතින දුර්වලතාවය මත ඉන්ධන දහනය අධික බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධව සිදු කරන ලද භෞතික නියැදි පරීක්ෂාවකට අනුව අලුත්වැඩියා කරනලද ඉන්ධන පොම්පයකින් ධාවනය කළ හැකි කිලෝමීටර ප්‍රමාණය 3.8 සිට 4.0 ක පරාසයක වූ අතර මණ්ඩලයට අයත් සෑම ඩිපෝවක්ම බස් රථ වල ඉන්ධන තුලනය කරනුයේ ලීටරයකට කි.මී.2.5 ත් 3.1 ත් අතර පරාසයක බැවින්, ඉන්ධන තුලනය ලීටරයකට කිලෝමීටර් 3.8 ක ප්‍රමාණයකින් පවත්වා ගැනීමේදී ඉන්ධන ලීටරකින් ධාවනය වන කිලෝමීටර් ප්‍රමාණය 0.7 ක් එනම් සියයට 18 ක ප්‍රතිශතයකින් වැඩි විය යුතු අතර වාර්ෂික ඉන්ධන පිරිවැය රු.7,274,781,435 කින් අඩු කර ගත හැකිවීම පිළිබඳ කළමණාකරණයේ අවධානය යොමුව නොතිබුණි. | ඉන්ධන පොම්ප අළුත්වැඩියා කර ධාවනය වන අඩු ඉන්ධන ක්‍රියාකාරිත්වයක් සහිත බස්රථ වලට සවි කිරීම තුළින් ඉන්ධන ක්‍රියාකාරිත්වය ඉහළ මට්ටමකට ගෙන ආ හැකි බව පිළිගන්නා අතර, වර්තමානයේ ප්‍රාදේශීය වැඩපොළ තුළ ඉන්ධන පොම්ප අළුත්වැඩියා කිරීම උපරිම ධාරිතාවයකින් සිදු කරනු ලබයි. | බස් රථ වල ඉන්ධන පොම්ප අළුත්වැඩියා කර ධාවනයට යොදවා ඒ තුළින් ඉන්ධන වියදම අඩුකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මාතර ඩිපෝව විසින් 2023 වර්ෂයේදී සමාගම් 03 ක් මගින් මිලදී ගන්නා ලද පෙරසවි ටයර් හා නැවත පුරවන ලද ටයර් අකාලයේ අසාර්ථක වීම පිළිබඳව 2023 ජූලි, අගෝස්තු හා සැප්තැම්බර් මාසවල නියැදියක් පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ පරිදි එකී සමාගම් විසින් මිලදී ගන්නා ලද ටයර්වල අකාලයේ අසාර්ථක වීම් සඳහා ප්‍රතිදාන ලෙස අය කර ගත යුතු රු.4,248,303 ක මුදල අය කර ගැනීම සඳහා ඩිපෝවේ කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | විගණය මගින් පෙන්වා දී ඇති කරුණ සත්‍යය බව පිළිගනිමි. | අකාලයේ අසාර්ථක වීම් පිළිබඳව නිසි පරිදි වාර්තා තබා ගෙන නිවැරදිව ප්‍රතිදාන අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | හක්මණ ඩිපෝවේ නැවත පිරවූ ටයරයක උපයෝජිත ප්‍රතිශතය සියයට 32 ක් වන අතර, පෙරසවි ටයරයක උපයෝජිත ප්‍රතිශතය සියයට 20.5 කි. මේ අනුව 2023 වර්ෂයේ ටයර් පෙරසවි කිරීමේ හා නැවත පිරවීම් උපයෝජිත ප්‍රතිශතයෙහි සාමාන්‍ය අගය සියයට 26.25 කි. 2023 වර්ෂයේ හක්මණ ඩිපෝව මගින් මිලදී ගත් නැවත පිරවූ හා පෙරසවි කරන ලද ටයර්වල වටිනාකම රු.41,742,502 ක් වූ අතර, ටයර් අකාලයේ අසාර්ථක වීම හේතුවෙන් උපයෝජනය නොවූ වටිනාකම වන රු.30,785,095 ක් සඳහා ප්‍රතිදාන අය කර ගැනීමට ඩිපෝ කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා ඉංජිනේරු අංශයේ අයකිරීම් වාර්තා මේ වන විට ගබඩාවට ලබා දී ඇති අතර එම වර්ෂයේ මුළු අයකිරීම් වටිනාකම පෙන්වා ඇත්තේ රු.8,776,662 කි. එම මුදලින් මේ වන විට රු.1,393,372 ක මුදලක් කොටස් වශයෙන් අය කිරීම් සිදු කර ඇත. | අකාලයේ අසාර්ථක වීම් පිළිබඳව නිසි පරිදි වාර්තා තබා ගෙන නිවැරදිව ප්‍රතිදාන අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ඉන්ධන නිකුත් කිරීම සම්බන්ධව තලංගම ඩිපෝ කළමනාකරු හා අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම සමඟ ඇති කර ගෙන තිබූ අවබෝධතා ගිවිසුමකට අනුව පළමුව රු.500,000 ක තැන්පත් මුදලක් තැබීමටත් එම තැන්පතු මුදලින් සියයට 80 ක් දක්වා ඉන්ධන නිකුත් කිරීමටත් එකඟ වී තිබුණි. අවබෝධතා ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ලබා දිය හැකි ණය සීමාව රු.400,000 ක් වූ අතර, එම ණය සීමාව ඉක්මවා රු.1,978,010 ක් වටිනා ඉන්ධන, ඩිපෝ කළමනාකරණය විසින් ණය පදනම මත එකී සමාගම වෙත ලබා දී තිබූ අතර එසේ ඉන්ධන නිකුත් කිරීම වෙනුවෙන් ඩිපෝවට ලැබිය යුතුව තිබූ රු.2,378,010 ක මුදල අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | අධිවේගී ප්‍රවාහන සමාගම ඇවර කරන බවට අමාත්‍ය මණ්ඩල තීරණය දැනුම් දුන් පසු දුන් රු.1,511,560/- ක් වටිනා අංක 144266 හා 144253 දරන චෙක්පත් 02 අගරු විය. ඉන් අනතුරුව අදාළ බස්රථ සඳහා ඩීසල් ලබා දීම අත්හිටවනු ලැබීය. | මේ පිළිබඳව පූර්ණ පරීක්ෂණය ක් සිදු කර සීමා ඉක්මවමින් බලතල අයථා ලෙස භාවිතා කර සිදු කරන ලද පාඩුවට වගකිව යුත්තන් හඳුනා ගත යුතුය. |
| (ඉ) | රිය අනතුරු වන්දි නඩු වලින් විසඳුම් ලබා දී තිබූ NWP/HCCA/KUR/106/2019/F දරණ නඩුවේ තීන්දුව හා කාර්යය සටහන් අනුව | අංක NWP/HCCA/KUR/106/2019/F දරන නඩුවේ තීන්දුව | වන්දි ප්‍රතිපූර්ණ ය කිරීමට |

| | | | |
|---|---|---|---|
| | රියදුරුගේ නොසැලකිලිමත්භාවය හේතුවෙන් 2023 වර්ෂයේදී රු.3,965,000 ක් වන්දි වශයෙන් ගෙවා තිබූ අතර, වැල්ලවාය දිසා අධිකරණයේ පැවති නඩු අංක 1135/M දරණ නඩුවේදී රියදුරු වරද පිළිගැනීම හේතුවෙන් රු.2,125,000 ක වන්දියක් ගෙවා තිබුණි. මේ අනුව මණ්ඩලය විසින් ගෙවා තිබූ මුළු වන්දි මුදල රු.6,090,000 ක් වන අතර, මණ්ඩලය විසින් මෙම නඩුවට විෂය මූලික වූ බස් රථ දෙක රක්ෂණය කර නොතිබූ බැවින්, පාඩුව රක්ෂණයෙන් හානිපූරණය කර ගත නොහැකි වී තිබුණි. | මඟින් නියම වූ රු.3,965,000.00 ක මුදල 2023.08.23 වන දින පැමිණිලිකාරියට ගෙවන ලදී. එසේම වැල්ලවාය දිසා අධිකරණයේ නඩු අංක 1135/M නඩුවේ පැමිණිලිකරු රිය අනතුර හේතුවෙන්ම ස්ථිර ආබාධයකට ලක් වී ඇති බවට සාක්ෂි අධිකරණයේ ඉදිරිපත් වී ඇත. ඒ අනුව ස්ථිර ආබාධයකට ලක් වී ඇති බව යන කරුණ වන්දි ගෙවීමේදී වැඩි වන්දි ප්‍රමාණයක් නියම කිරීමට පාදක කරගෙන ඇත. | කටයුතු නොකිරීම සම්බන්ධව වගකිව යුත්තන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කටුබැද්ද අධිසුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවයෙහි රථ ඇණිය ආසන 51 ක් සහිත ND කාණ්ඩයට අයත් බස් රථ 02 කින් හා ආසන 39 ක් සහිත NB කාණ්ඩයට අයත් බස් රථ 67 කින් සමන්විත වන අතර, දෛනිකව සැලසුම් කළ ගමන් වාර සඳහා නියමිත පරිදි බස් රථ යෙදවීම තුළින් උපයා ගෙන තිබුණු දෛනික සාමාන්‍ය ආදායම රු.10,244,130 කි. නමුත් මණ්ඩලයේ දත්ත අනුව වාර්ෂිකව උපයා ගත හැකි ආදායම රු.මිලියන 3,178 ක් වුවද සමාලෝචිත වර්ෂය තුළ කටුබැද්ද අධිසුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවය මගින් උපයා ගෙන තිබූ ආදායම රු.මිලියන 836.39 ක් විය. මේ අනුව රු.මිලියන 2,341.61 කින් උපයා ගත හැකි ආදායම අඩු වී තිබුණි. | 2023 වර්ෂයේ සැප්තැම්බර් මස වන විට බස්රථ 21 ක් පමණ ධාවනයට යොදවා ඇත. ඉතිරි බස්රථ සියල්ල ආපදාවන් හේතුවෙන් ඩිපෝ පරිශ්‍රය තුළ ගාල් කර ඇත. මෙම බස්රථ අළුත්වැඩියා කිරීමේ කටයුතු ප්‍රමාද වීමට ප්‍රධානතම හේතුව වූයේ 2019 වර්ෂයේ සිට යුටෝන් බස්රථ වලට අවශ්‍ය අමතර කොටස් ආනයනය කිරීමට නොහැකි වීමයි. | මේ පිළිබඳව කළමණාකරණයේ දැඩි අවධානය යොමු කර බස් රථ අළුත්වැඩියා කර ධාවනයට යොදවා ආදායම් වැඩි කර ගැනීමට කාලසටහන් ආවරණය කර මගී ජනතාවට උපරිම සේවාවක් ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රුහුණ ප්‍රාදේශීය කාර්යාලය විසින් පාලනය වන ඩිපෝවන් විසින් ධාවනය කළ යුතු දුර ගමන් සේවා 41 ක් හා කෙටි ගමන් සේවා 124 ක් දීර්ඝකාලීනව ධාවනය නැවතී තිබූ බවත්, එම නිසා දෛනිකව අහිමි වන ධාවන | රුහුණු ප්‍රාදේශිකයේ ඩිපෝ මඟින් ධාවනය කරනු ලබන කෙටි දුර සේවා වලින් මගී අවශ්‍යතාවය මත ධාවනය කරනු ලබන බස්රථ | බස් රථ මිලදී ගැනීමේදී හා මෙහෙයුම් කටයුතු සිදු |

| | | | |
|---|---|---|---|
| | කිලෝමීටර් ප්‍රමාණය 43,245 ක් වන අතර, මෙම සේවා වාර 165 ක් ධාවනයට එක් නොකිරීම හේතුවෙන් 2023 වර්ෂය තුළදී මණ්ඩලයට අහිමි ව තිබූ ආදායම රු.2,430,801,450 ක් විය. | අවශ්‍යතාවය හදුනාගෙන බස්රථ ධාවනයට එක් කර ඇත. | කිරීමේදී මණ්ඩලයට පාඩු සිදු නොවන ලෙස හා මහජනතාවට උපරිම සේවයක් සැලසෙන පරිදි ධාවන කටයුතු සැලසුම් කළ යුතුය. |
| (ඇ) | රුහුණ ප්‍රාදේශිකයේ ඩිපෝවන් සතුව දක්ෂිණ අධිවේගී මාර්ගයේ ධාවන කටයුතු සඳහා පවත්නා කාලසටහන් අවශ්‍යතාවය වන කාලසටහන් 60 න් ආවරණය කරන ප්‍රමාණය 43 ක් වූ අතර, ඉතිරි කාලසටහන් අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට අවශ්‍ය බස් රථ 17 ක් ධාවනයට යෙදවීමට කටයුතු නොකිරීම හේතුවෙන් දෛනිකව රු.2,200,000 ක ආදායමක් අහිමි වී තිබූ අතර, 2023 වර්ෂය තුළදී මණ්ඩලයට අහිමි වූ සමස්ථ ආදායම රු.මිලියන 803 ක් විය. | රුහුණු ප්‍රාදේශිකය තුල ඇත්තේ බස්රථ 13 ක් පමණි. එම බස්රථ ද වර්ෂ 10 කට වඩා පැරණි බස්රථ වේ. එම බස්රථ වලින්ද ධාවනයට එක් කරනු ලබන්නේ බස්රථ 06 ක් පමණි. ඉතිරි කාලසටහන් අවශ්‍යතාවයෙන් කොටසක් 85% / 15% පදනම මත බස්රථ යොදවා ධාවනය කරනු ලබන අතර නව සුඛෝපභෝගී බස්රථ මිලදී ගැනීම අත්‍යවශ්‍ය වේ. | බස් රථ මිලදී ගැනීමේදී හා මෙහෙයුම් කටයුතු සිදු කිරීමේදී මණ්ඩලයට පාඩු සිදු නොවන ලෙස හා මහජනතාවට උපරිම සේවයක් සැලසෙන පරිදි ධාවන කටයුතු සැලසුම් කළ යුතුය. |

**3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 වගන්තියට අනුව මිලදී ගැනීම් සඳහා මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයට ලබා දිය හැකි අනුමත සීමාව රු.මිලියන 50 ක්ව තිබියදී, ඊට පටහැනිව මණ්ඩලයේ අශෝක් ලේලන්ඩ් සහ ටාටා වර්ගයේ බස් රථ සඳහා මාස දෙකකට අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම සඳහා පූර්ව සැලසුම් සකස් කොට වසරකට අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම සඳහා මිල කැඳවීම් සිදු කර ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රිස් (ඉන්දියා) සමාගම සහ ඊට වසරකින් පසු දෙවන සාරානුකූල ලංසුකරු වූ | මෙම සිද්ධිය සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අනුමත සීමාවන්ට යටත්ව මිලදී ගැනීම් පරිපාටිය ක්‍රියාවට නැගිය යුතු අතර, මිලදී |

නිම්බස් ඔටෝ මෝටිව් ලංකා සමාගමට ද 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩව සැපයීම් කිරීමට ඉඩ ලබා දීම තුළ එකී සමාගම් විසින් පිළිවෙලින් රු.1,583,900,400 හා රු.358,420,376 ක් වශයෙන් එකතුව රු.1,942,320,776 ක් වටිනා අමතර කොටස් සපයා තිබුණි. මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (තාක්ෂණ) විසින් 2012 නොවැම්බර් 20 දින ගෙන්වන ලද අමතර කොටස් ව්‍යාජ අමතර කොටස් බැවින් හා එම අමතර කොටස් දේශීය වෙළඳපොලෙන් සහනදායි අඩු මිලකට මිලදී ගත හැකි බව පෙන්වා දී එකී අමතර කොටස් ප්‍රතික්ෂේප කර තිබුණි. එම සීමාව ඉක්මවා අදාළ සමාගම සමඟ ගිවිසුම් ගතව තිබීම, වෙළඳ ගිවිසුමේ පිටපතක් නීතිපතිවරයා වෙත යොමු කර ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගෙන නොතිබීම හා අත්සන් කරන ලද ගිවිසුමේ මණ්ඩලයට අවාසිදායක කොන්දේසි ඇතුළත් කිරීම හා ලංසු වටිනාකම් ඇතුළත් කර නොතිබීම හා අදාළ ටෙන්ඩරය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලබා ගෙන නොතිබුණි. එමෙන්ම එකී ගිවිසුමේ 4.2 වගන්තිය අනුව ආනයනය කරනු ලබන අමතර කොටස් සඳහා දින 90 ක ණය සහන කාලයක් ලබා දීම හා මුදල් ගෙවීමකින් තොරව ගතවන සෑම මාසයකටම සියයට 5 ක පොලියක් ගෙවීමට සිදුව තිබියදී හා මණ්ඩලයට මූල්‍ය ස්ථාවරත්වයක් නොමැති තත්ත්වයක් තුළ මෙරටට ගෙන්වන ලද මුල්ම අමතර කොටස් තොගය තත්ත්වයෙන් බාල අමතර කොටස් වීම හේතුවෙන් එම අමතර කොටස් තොගය ප්‍රතික්ෂේප කර ටෙන්ඩරය අවලංගු කර නැවත ටෙන්ඩර පරිපාටියකට යන ලෙස කමිටුවක් මගින් නිර්දේශ කර තිබිය දී වසර 04 ක් තිස්සේ අඛණ්ඩව අත්‍යාවශ්‍ය නොවන අමතර කොටස් මිලදී ගෙන තිබුණි. මිලදී ගෙන තිබූ අමතර කොටස් සඳහා යාවත්කාලීනව ගෙවීම් නොකිරීම හේතුවෙන් සැපයුම්කාර සමාගම විසින් මණ්ඩලයට එරෙහිව පැවරූ බේරුම්කරන නඩුවේ 2019 මැයි 09 දිනැති සමථය අනුව මණ්ඩලය විසින් ගෙවිය යුතුව තිබූ ඇමරිකන් ඩොලර් 3,722,104 කට අදාළ රු.664,722,000 ක මුදල 2023 වර්ෂයේදී ගෙවා තිබුණි. තවද යථෝක්ත ටෙන්ඩරයට වසරක කාලයක් ඉක්මවා තිබියදී එය අවලංගු කර නව ටෙන්ඩරයක් කැඳවීම වෙනුවට දෙවන

ගනු ලබන භාණ්ඩ තාක්ෂණිකව සුදුසු බවට තහවුරු කර ඒ සඳහා ගෙවීම් කළ යුතු වේ. එමෙන්ම ප්‍රසම්පාදන පරිපාටි උල්ලංඝණය කරමින් කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය.

| | | | |
|---|---|---|---|
| | සාරානුකූල ලංසුකරු වන නිම්බස් ඔටෝමෝටිව් සමාගමට ඩිපෝ 26 ක් සඳහා අමතර කොටස් සැපයීමට ටෙන්ඩරයක් පිරිනැමීම සහ ඔහුට තීරු බදු සහන ලබා දීම සාවද්‍ය බව හා නීතියට පටහැනි බව දැන දැනම 2012 ජුනි 08 දින රැස් වූ අධ්‍යක්ෂ මණ්ඩලය සැපයුම්කරුට ටෙන්ඩරය පිරිනැමීමට තීරණය කර තිබුණි. | | |
| (ආ) | ඉන්දියානු ණය නියම ගිවිසුම යටතේ ශ්‍රී ලංකා රජයට ලැබුණු ණය මුදලින් ඉතිරිව තිබූ ඇමරිකානු ඩොලර් මිලියන 20 උපයෝගි කර ගෙන අවුරුදු 15 ට වඩා පැරණි බස් රථ මණ්ඩලයේ රථ ඇණියෙන් ඉවත් කර දැනට පවත්වාගෙන යනු ලබන නාගරික සේවාවන් අඩාල වීමකින් තොරව පවත්වාගෙන යාම සඳහා පිටුපස උස් ඇන්ද සහිත ආසන 50-54 (2x2) නව බස් රථ 400 ක් හා පිටුපස උස් ඇන්ද සහිත ආසන 32-35 (2x2) බස් රථ 100 ක් වශයෙන් බස් රථ 500 ක් මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2018 මැයි 23 දින ලබා දුන් ප්‍රතිපත්තිමය තීරණය මත ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණි. ඒ අනුව අදාල ප්‍රසම්පාදන ලියවිලි හා තාක්ෂණික පිරිවිතර සකස් කර ලංසු කැඳවීමට අවශ්‍ය සියළු කටයුතු සිදු කර තිබියදී, 2020 ජනවාරි 01 දින එවකට සිටි ප්‍රවාහන අමාත්‍යවරයා විසින් කිසිදු විද්‍යාත්මක පදනමකින් තොරව ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය වෙනස් කර අමාත්‍යවරයාගේ වාචික උපදෙස් මත ආසන 32-35 නව කුඩා බස් රථ 500 ක් හා ආසන 42-45 පිටුපස උස් ඇන්ද සහිත නව බස් රථ 100 ක් වශයෙන් බස් රථ 600 ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලදී. කෙසේ වෙතත්, නැවත 2023 ජනවාරි 03 දින ලබා දී තිබූ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර ආසන 32 ක් සහිත Ashok Leyland Lynx නව බස් රථ 500 ක් එක් බස් රථයක් USD 26,662.50 බැගින් මුළු මුදල වන USD 13,311,250 ක මුදලකට Ashok Leyland Limited India වෙතින් මිලදී ගැනීමට තීරණය කර එකී ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. මෙම බස් රථ සඳහා ගෙවා තිබූ මුළු මුදල රු.මිලියන 5,513 ක් වන අතර, එක් බස් රථයක වටිනාකම රු.මිලියන 11.02 කි. ආසන 32-35 බස් රථයක ඇස්තමේන්තු මිල රු.මිලියන 5 කි. මේ අනුව ආසන 32 බස් රථයක් සඳහා ඇස්තමේන්තුගත මිලට වඩා රු.මිලියන 6.02 ක් වශයෙන් රු.මිලියන 3,010 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | 2018.06.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය වෙනස් කොට 2020.01.01 දින ඉදිරිපත් කර තිබූ බස් රථ මිලදී ගැනීමේ යෝජනාව අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇත. තාක්ෂණික දෝෂ වගකීම් කාලය තුළ අශෝක් ලේලන්ඩ් ආයතනය මගින් සිදු කර දෙන බව දන්වා ඇත. | මූලික අවශ්‍යතාවන් නිසි පරිදි හඳුනා ගෙන මූල්‍ය ශක්‍යතාවය අනුව මහජන අවශ්‍යතාවයන් කාර්යක්ෂම හා සුවපහසු ලෙස ඉටු කිරීමට හැකිවන පරිදි තීන්දු තීරණ ගෙන බස් රථ මිලදී ගැනීමේදී මගීන්ට සුව පහසුව ගමන් කළ හැකි බස් රථ සේවාවක් හඳුන්වා දිය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) මහනුවර දකුණ ඩිපෝව මගින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 003100101199662 දරන ජංගම ගිණුමෙහි 2014 ජනවාරි 01 දින රු.2,237,831 ක් වටිනා චෙක්පතක් තැන්පත් කර තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින සකස් කර තිබූ බැංකු සැසඳුමෙහි එම චෙක්පත තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පතක් ලෙස පෙන්වා තිබූ අතර, එය නිරවුල් කිරීම සඳහා 2022 ඔක්තෝබර් 12 දින රු.100,000 ක වියදමක් දරා බැංකු ගිණුමට අදාළ බැංකු ප්‍රකාශන ලබා ගෙන තිබුණද එය පරීක්ෂාවට භාජනය කර චෙක්පත සම්බන්ධව නිසි පියවර ගැනීමට මූල්‍ය අංශය විසින් කටයුතු නොකිරීම තුළ අදාල චෙක්පත සාවද්‍ය පරිහරණයකට යෙදවීමට සැලසුම් නොකළ බවට සැහීමකට පත්වීම සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | මෙම ශේෂය අතීතයේ සිට පැවත එන ශේෂයකි. මෙම ශේෂය පිළිබඳව මීට පෙරද විමසීම් කර ඇතිමුත් මෙම ශේෂය පිළිබඳව කිසිදු ලේඛනයක් සොයා ගැනීමට නොහැකි වී ඇත. | මේ පිළිබඳව කඩිනමින් පරීක්ෂා කර බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රථ ඇණිය ධාවන තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා භාණ්ඩාගාර හා ශ්‍රී ලංගම ප්‍රතිපාදන යොදා ගනිමින් යටිනුවර ප්‍රාදේශීය වැඩපල තුළ ඩිපෝවන් මගින් එවනු ලබන පැරණි එන්ජින් කට්ටල, පැරණි ගියර් පෙට්ටි, පැරණි ඉන්ධන පොම්ප, පැරණි ඉන්ධන විදින, සිලින්ඩර් හෙඩ්, පැරණි ස්ටාටර් මෝටර් සහ පැරණි ඕල්ටනේටර් අළුත්වැඩියා කර බස් රථවල සවි කර මුදා හැරීම සඳහා 2023 වර්ෂයට රු.මිලියන 396.60 ක් වෙන් කර ඒකක 3,480 ක නිෂ්පාදන ඉලක්කයක් ලබා දී තිබූ නමුත්, නිෂ්පාදනය කර තිබූ ප්‍රමාණය ඒකක 3,420 ක් විය. ඒ සඳහා වැය කර තිබූ මුදල රු.මිලියන 268.18 ක් වූ අතර, එයින් ප්‍රතිපාදන උපයෝජිත ප්‍රතිශතය සියයට 67 ක් බව නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී අපේක්ෂිත ඉලක්ක සම්පූර්ණ කිරීමට මණ්ඩලය අසමත් වී තිබුණි. | එංජින්, ගියර් පෙට්ටි, බස් බොඩි, ඉන්ධන පොම්ප, ඉන්ධන විදින යන්ත්‍ර, සිලින්ඩර් හෙඩ්, ඕල්ටනේටර් සහ ස්ටාටර් මෝටර් යන උපාංග සම්පූර්ණයෙන් අළුත්වැඩියා කිරීමේදී එහි ප්‍රධාන අමතර කොටස් සඳහා වැයවන වියදම ඇස්තමේන්තු කරනු ලබන, අතර, අළුත්වැඩියා කරනු ලබන උපාංග වල නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තු ගත පිරිවැයට වඩා අඩුවීමට මෙම කරුණ බලපානු ලැබේ. | මිලදී ගැනීම් සඳහා ප්‍රමුඛතාවය ලබා නොදී අමතර කොටස් හා උපාංග වැඩපොල තුළ අළුත්වැඩියා කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දී එම උපාංග අළුත්වැඩියා කර ධාවනයට යෙදවීම තුළින් පිරිවැය අවම කර මහජන සේවාවක් ලබා දීමට කටයුතු කළ යුතුය. |

## 3.7 තොග, දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 මැයි 09 දිනැති බේරුම්කරණ නියෝගයට අනුව ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් ආයතනය සඳහා නොගෙවූ බිල්පත් වලට ගෙවීම් කරන ලද රු.75,384,696 ක වටිනාකමින් යුත් ලැබීම් නියෝග 20 කට අදාළ තොග අයිතම් ගබඩා පොත්වලට ගෙන තිබූ අතර, එම අමතර කොටස් භාවිතා කරන ටාටා වර්ගයේ හා ලේලන්ඩ් වර්ගයේ පැරණි බස් රථ දැනට භාවිතයෙන් ඉවත්ව තිබූ බැවින්, නිශ්කාර්යව පැවති අතර අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | දැනට මීට අදාළ බේරුම්කරණ කටයුතු අවසන් කර ඇති අතර ඊට අදාළ තොග ශ්‍රී ලං.ග.ම. තොගයට ගනිමින් ඇත. එසේ ලබා ගන්නා තොගයන්හි පවතින අයිතම ශ්‍රී ලං.ග.ම. රථ ඇණිය සඳහා භාවිතා කළ හැකි නම් ඒවා හඳුනාගෙන ඩිපෝවන් වෙත ලබා දීමට කටයුතු කරනු ලබන අතර, එකී තොග භාවිතා කළ නොහැකි නම් ඊට අදාළ අපහරණ කටයුතුද ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත. | තොග අයිතම වල වටිනාකම තක්සේරු කර තොගයට ගැනීමටත් භාවිතා නොකරන තොග සම්බන්ධව අවශ්‍ය ඩිපෝවන් වලට ලබා දීමට හෝ අපහරණයකිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | විධිමත් පවරා ගැනීමකින් තොරව ලග්ගල මහවැලි සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක ඩිපෝවක් ආරම්භ කිරීම සඳහා 2021 සැප්තැම්බර් 11 දින මුල් ගල තබා තිබුණ ද 2023 නොවැම්බර් මාසය දක්වා එම ඉඩම පවරාගෙන ඩිපෝව ඉදි කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම ඉඩමේ ඩිපෝව සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදි කරන තෙක් ඩිපෝවේ මෙහෙයුම් කටයුතු සඳහා තාවකාලිකව අවශ්‍ය ධාවන අංශය, මුදල් අංශය හා ඉංජිනේරු අංශය සඳහා කාර්යාල පහසුකම් සැපයීමට ධාවනයෙන් ඉවත් කරන ලද බස් රථ 03 ක් උපයෝගි කර ගනිමින් වායුසමීකරණය කරන ලද කාර්යාල බස් රථ 03 ක් නිර්මාණය කර තිබුණි. ඒ සඳහා රු.1,632,440 ක මුදලක් වැය කර තිබුණු නමුත් එම බස් රථ නව ඩිපෝවේ කාර්යාල කටයුතු සඳහා භාවිතයට ගෙන ඩිපෝව ආරම්භ කර නොතිබුණි. | ලග්ගල පල්ලේගම ඉඩම් ඔප්පු සකස් කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය මැනුම් කටයුතු සිදුකර අවශ්‍ය බිම් ප්‍රමාණය හඳුනා ගැනීමට ශ්‍රී ලංගම පාර්ශවයෙන් සිදුකළ යුතු මිනින්දෝරු ගාස්තු ගෙවීම් සිදුකර ඇති අතර, ශ්‍රී ලංගම ඉඩම ඩිපෝව සඳහා පවරා ගැනීමට අදාළ ලේඛන මහවැලි අධිකාරියේ නේවාසික ඉංජිනේරු වෙත භාර දුන්න ද මහවැලි අධිකාරියේ බලයලත් නිලධාරීන් විසින් එම ලේඛන අත්සන් කර මෙතෙක් ශ්‍රී ලං.ග.ම. වෙත භාර දී නොමැත. | පූර්ව සැලසුම් කිරීමකින් තොරව සහ ශක්‍යතා අධ්‍යයනයකින් තොරව සිදු කරන මෙම කටයුතු හරහා සිදුවන පාඩුව අදාළ වගකිව යුත්තන්ගෙන් අය කර ගත යුතුය. |
| (ඇ) | ටාටා වර්ගයේ බස් රථ සඳහා භාවිතා කරන ලද රු.518,408 ක වටිනාකමින් යුතු අමතර කොටස් වර්ග 83 ක් පමණ මොරටුව ඩිපෝවේ ගබඩාවේ තිබූ අතර, ඩිපෝව සතුව ටාටා වර්ගයේ බස් රථ නොමැති වීම නිසා මෙම අමතර කොටස් භාවිතා කිරීමට හැකියාවක් නොමැති බව දන්වා තිබුණ ද මෙම තොග අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණන විමසුමේ සඳහන් කර ඇති පරිදි මොරටුව ඩිපෝවේ ටාටා වර්ගයේ බස්රථ නොමැති බව සඳහන් කර තිබුණද ටාටා වර්ගයේ බස්රථ 03 ක් දැනට ධාවනයේ යොදවා ඇත. තවද ඉසුසු බස්රථ අමතර | තොග අයිතමවල වටිනාකම තක්සේරු කර තොගයට ගැනීමටත් භාවිතා නොකරන |

| | | | |
|---|---|---|---|
| | එමෙන්ම වටිනාකම තක්සේරු නොකළ ඉසුසු වර්ගයේ අමතර කොටස් වර්ග 34 ක් ද ගබඩාවේ තිබූ අතර, එම තොග තක්සේරු කර තොගයට ගැනීමට කටයුතු කර නොතිබුණි | කොටස් වර්ග 34 ක් ඩිපෝ ගබඩාවේ තිබෙන අතර වෙනත් ඩිපෝවන්හි අවශ්‍යතාවයන් මත ලබා දීමට හැකියාව ඇත. | තොග සම්බන්ධව අවශ්‍ය ඩිපෝවන් වලට ලබා දීමට හෝ අපහරණයට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මණ්ඩලයේ ඒකල ප්‍රධාන ගබඩාවේ 2023 වර්ෂයේ අවසානයට සිදු කළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව අමතර කොටස් වර්ග 50 කට අදාළව රු.7,186,995 ක වටිනාකමින් යුත් අමතර කොටස් 10,039 ක් දැනට භාවිතයට ගත නොහැකි තත්ත්වයේ භාණ්ඩ බව වාර්තා කර තිබුණු නමුත් අපහරණයට කටයුතු කර නොතිබුණි. | වාර්තාව පදනම් කරගෙන ශ්‍රී ලං.ග.ම. සියළු ඩිපෝවන් වෙත දැනුවත් කර ඇත්තේ, එම ලේඛන තුළ අඩංගු අයිතම වලින් ඩිපෝවන් වලට අවශ්‍ය අමතර කොටස් තිබේ නම් එම අමතර කොටස් අදාළ ඩිපෝවන් වෙත ලබාදීමට කටයුතු කල හැකි බවයි. | තොග අයිතම වල වටිනාකම තක්සේරු කර තොගයට ගැනීමටත් භාවිතා නොකරන තොග සම්බන්ධව අවශ්‍ය ඩිපෝවන් වලට ලබා දීමට හෝ අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඉ) | සෙමින් චලනය වන තොග අයිතමයක් වන ලේලන්ඩ් 400 Injecter Pump Repair Kit 504 ක ශේෂයක් 2011 නොවැම්බර් 28 දිනට ගබඩාවේ තිබියදී 2011 නොවැම්බර් 22 දින ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් සමාගමෙන් එකක් රු.15,273.44 ක් බැගින් රෙපයාර් කිට් 600 ක් රු.9,164,064 ක වටිනාකමට මිලදී ගෙන තිබුණි. මෙම තොගයේ 2022 දෙසැම්බර් 20 දිනට ශේෂය රෙපයාර් කිට් 267 ක් ව තිබූ අතර, එදිනෙන් පසු එනම් 2024 ජනවාරි 30 දින දක්වා කිසිදු රෙපයාර් කිට් කට්ටලයක් නිකුත්ව නොතිබුණි. මිලදී ගනු ලැබූ රෙපයාර් කිට් භාවිතයට ගනු ලබන අයිතමයක් බව පෙන්වීම සඳහා ප්‍රාදේශීය වැඩපොල හා ඩිපෝවන් වෙත නිකුත් කර තිබුණි. මෙම තොග පිළිබඳ විගණනය විසින් ලබා ගත් තහවුරුවකට අනුව ගිංතොට වැඩපලේ පමණක් රු.870,586 ක් වටිනා භාවිතයට නොගත් රෙපයාර් කිට් 57 ක් තිබූ බව නිරීක්ෂණය විය. මෙම භාවිතයට නොගෙන ගබඩා කර තිබූ තොග අයිතම්වල වටිනාකම රු.4,948,595 ක් විය. | විමසුමේ දක්වා ඇති පරිදි 2021.11.22 දින ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් සමාගමෙන් එකක් රු.15,273.44 ක් බැගින් රෙපයාර් කිට් 600 ක් රු.9,164,064/- ක වටිනාකමකට මිලදී ගෙන නොතිබුණි. මෙම ගිණුම් කාලච්ඡේදය තුළ ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් සමාගම වෙතින් කිසිදු ඇණවුමක් සිදුකර නොමැත. | දිනය 2011/11/22 ලෙස සංශෝධිත විය යුතු අතර, තොග අයිතම වල වටිනාකම තක්සේරු කර තොගයට ගැනීමටත් භාවිතා නොකරන තොග අවශ්‍ය ඩිපෝවන් වලට ලබා දීමට හෝ අපහරණය කිරීමටත් කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ඉදිරිපත් කරන ලද වෙනත් වත්කම් උපලේඛනය තුළ අවස්ථා 49 ක් තුළදී ඇතුළත් කර තිබූ රු.26,344,359 ක වටිනාකමක් සහිත වත්කම් නිශ්චිතව හඳුනාගෙන නොතිබූ අතර ඒවා නිවැරදිව හඳුනාගෙන වත්කම් අයථා පරිහරණයට ලක් වීමට ඉඩ අවුරා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | 2017 වර්ෂයේ සිට මිලදී ගනු ලබන සියළු වත්කම්, වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමේදී නිවැරදිව හඳුනාගෙන අදාළ තොරතුරු ඊට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත. | වත්කම් හා දේපල පිරියත උපකරණ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 3.8 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවිස්සාවේල්ල ඩිපෝවේ බස් රථ අළුත්වැඩියා කටයුතු සඳහා 2023 ජුනි, ජූලි හා අගෝස්තු මාසවල අමතර කොටස් මිලදී ගැනීම සඳහා රු.10,582,494 ක් වැය කර තිබුණි. දේශීය හදිසි මිලදී ගැනීම් සඳහා ඩිපෝ කළමණාකරණයට රු.50,000 ක උපරිමයකට යටත්ව අමතර කොටස් මිලදී ගැනීමට අත්තිකාරම් සීමාවක් ලබා දී තිබූ අතර, එම සීමාව කුමන අමතර කොටස් අයිතම් මිලදී ගැනීම සඳහා කොපමණ කාලයකට හා දිනකට ද යන්න සඳහන් කර නොතිබීම හේතුවෙන් එක් ගෙවීම් වවුචරයක් රු.50,000 ක සීමාවට යටත්ව ගෙවීම් වවුචර ඉදිරිපත් කරමින් 2023 ජුනි 02 දින පමණක් රු.691,470 ක් වටිනා අමතර කොටස් මිලදී ගෙන තිබුණි. ඊට අමතරව ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තිය අනුව ජාතික තරඟකාරි ලංසු කැඳවීම් හරහා සිදු කළ යුතුව තිබූ අමතර කොටස් මිලදී ගැනීම් ද මිල සැඳහුම් ක්‍රමය යටතේ හදිසි මිලදී ගැනීම් ලෙස සිදු කර තිබූ අතර, පරීක්ෂාවට භාජනය කරන ලද 2023 ජුනි හා ජූලි මාසවල හිනෝ බස් රථ සඳහා අවශ්‍ය වෙළඳපොලේ එකක් රු.75,000 ක් වටිනා ටර්බෝචාජර් එකක් රු.120,000 බැගින් රු.360,000 කට ටර්බෝචාජර් 03 ක් රු.135,000 ක් වැඩිපුර ගෙවා මිලදී ගෙන තිබුණි. | ශ්‍රී ලං.ග.ම. විසින් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තිය අනුව ජාතික තරඟකාරි ලංසු කැඳවීම ක්‍රමවේදය යටතේ එම වසරට අදාළ ඉංජිනේරු අංශය මඟින් හඳුනාගත් අවශ්‍යතා සඳහා එම වසරට අදාළ අනුමත ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කරනු ලබයි. අනුමත වූ ප්‍රසම්පාදන මඟින් ලබාගත හැකි අයිතමයන්, එම අයිතමයන් ලබාගත යුතු ආයතනයේ මිල හා ප්‍රසම්පාදනය වලංගු කාලසීමාව සියළුම ප්‍රාදේශීය කළමනාකරුවන්, ප්‍රාදේශීය ඉංජිනේරු හා ප්‍රාදේශීය මුදල් කළමනාකාර වෙත ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් අංශය මඟින් දැනුම් දීමක් කරනු ලබන අතර එයට අනුකූලව මිලදී ගැනීම් සිදු කරනු ලබයි. | මේ පිළිබඳ පරීක්ෂා කර බලා මෙවැනි අක්‍රමිකතා සිදුවීමට ඇති ඉඩකඩ හා අවභාවිතාවන් මග හරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සිවිල් ඉංජිනේරු අංශය විසින් ප්‍රධාන කාර්යාලයේ ඇති ජංගම පරීක්ෂණ අංශයේ වර්ග අඩි 1,410 ක පොළොව ටයිල් ඇල්ලීම ඇතුළු සිවිල් වැඩ රු.2,166,308 කට ඇස්තමේන්තු කර තිබූ අතර, ඒ සඳහා අවශ්‍ය භාණ්ඩ හා අමුද්‍රව්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 වගන්තිය අනුව මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවා මිලදීගත යුතු වුවත් ව්‍යාජ මිල කැඳවීම් මඟින් රු.873,563 | 2023 වර්ෂය සඳහා සිවිල් ඉංජිනේරු කාර්යය සඳහා ආයතන 08 ක් ලියාපදිංචි කර ඇත. දක්වා ඇති ඉංජිනේරු කාර්යය සඳහා ඉහත සැපයුම්කරුවන් වෙතින් මිල කැඳවීම සිදුකරන ලද අතර, ඒ අතරින් සාරානුකූල අවම | මිල සැඳහුම් ක්‍රමය යටතේ මිලදී ගැනීම සිදු කිරීමේදී ඒ පිළිබඳව විචක්ෂණශීලී ව කටයුතු කර එවැනි පාඩු සිදුවීම් |

| | | | |
|---|---|---|---|
| | කට මිලදී ගෙන තිබුණි. මෙම මිලදී ගැනීම තුළ ඇතුළත් භාණ්ඩ අයිතම් 08 ක වෙළපොල මිල ගණන් ප්‍රධාන කාර්යාලය අවට සැපයුම්කරුවන්ගෙන් අඩු මිලට ලබා ගත හැකිව තිබියදී, පිලියන්දල ප්‍රදේශයෙන් අදාළ ද්‍රව්‍ය මිලදී ගෙන එම ද්‍රව්‍ය හා භාණ්ඩ සඳහා රු.302,940 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි. මේ අනුව මණ්ඩලයට රු.302,940 ක මූල්‍යමය අලාභයක් සිදුව තිබුණි. | මිලක් ඉදිරිපත් කර ඇති, සැපයුම්කරු ලෙස අනුමත වූයේ පිළියන්දල ප්‍රදේශයේ පිහිටි ආයතනයකි. | වළක්වාලිය යුතුය. |
| (ඇ) | 2023 වර්ෂය සඳහා රථ ඇණිය ධාවන තත්ත්වයේ පවත්වාගෙන යාමට අවශ්‍ය අළුත් ටයර් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ ටෙන්ඩරය තාක්ෂණික පිරිවිතරයන්ට අනනුකූල බවට තාක්ෂණික ඇගයීම් කමිටුව තීරණය කර තිබියදී අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව මගින් ලබාදුන් නිර්දේශ මත අදාළ සමාගම වෙත ටෙන්ඩරය පිරිනැමීමට පෙර එනම් 2023 ජූලි 10 දින නව ටයර් 2,660 කට ඇණවුමක් ලබා දී තිබුණි. ඇණවුම අනුව ලද ටයර් තාක්ෂණිකව සුදුසු නොවන බව ටයර් පරීක්ෂාවට භාජනය කළ නිලධාරීන් විසින් ප්‍රකාශ කර ප්‍රතික්ෂේප කර තිබියදී ඒවා භාවිතය සඳහා ඩිපෝ වලට නිකුත් කර තිබුණි. ඉන්පසුව අදාළ සැපයුම්කරුට උක්ත ටෙන්ඩරය පිරිනමා තිබූ අතර, එකී සමාගමෙන් රු.355,725,222 කට මිලදී ගනු ලැබූ නව ටයර් 5,842 ක් 2024 ජනවාරි 31 දින වන විට ඒකල ගබඩාවට ලැබී තිබුණි. මෙම ටයර් තොගයෙන් 2023 වර්ෂයේදී ගම්පහ ප්‍රාදේශිකයට නිකුත් කර තිබූ ටයර් ප්‍රමාණය 516 ක් වන අතර, එයින් රු.2,618,313 ක වටිනාකමක් සහිත ටයර් 43 ක් එනම් සියයට 08 ක් අකාලයේ අසාර්ථක වී තිබූ බැවින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 වගන්තියේ විධිවිධානවලට අනුව කටයුතු කර නොතිබුණි. | ටයර් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීමේ දී ලංසු පත්‍රිකාව මඟින් ඉදිරිපත් කළ පිරිවිතරයන් හා තෝරා ගත් ලංසුකරු ලබා දී තිබූ පිරිවිතරයන් කොතරම් දුරට ගැළපෙන්නේ ද යන්න බලා ලිඛිත තොරතුරු පදනම් කර ගනිමින් තාක්‍ෂණ ඇගයීම් කමිටුව Ferentino Tyre සමාගමේ ටයර් මිලදී ගැනීම නිර්දේශ කර තිබුණ ද මණ්ඩලීය පිළිවෙත් අනුව භෞතික පරීක්‍ෂාවක් සිදු කර පිරිවිතරයන්ට අනුකූල වූ ටයර් පමණක් භාර ගැනීම සිදුවේ . | මිලදී ගැනීම් සිදු කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු අතර, මිලදී ගනු ලබන ටයර් තාක්ෂණිකව සුදුසු බවට පරීක්ෂා කර භාවිතය සඳහා මුදා හැරිය යුතුය. |
| (ඈ) | මණ්ඩලයේ රථ ඇණිය සඳහා 2023 වර්ෂයට අවශ්‍ය ග්‍රීස් සහ ලිහිසි තෙල් වර්ග මිලදී ගැනීම සඳහා රු.මිලියන 1,283 ක මුදලක් වෙන් කර තිබූ අතර, ඒ සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2022 ඔක්තෝබර් 14 දින ආරම්භ කර 2023 මැයි 23 දින වන විට ටෙන්ඩරය ප්‍රදානය කර මිලදී ගැනීම් සිදු කළ යුතුව තිබුණි. නමුත් මාස 04 කට අවශ්‍ය ග්‍රීස් හා ලිහිසි තෙල් පමණක් මිලදී ගැනීම සඳහා වූ රු.681,999,047 ක මූල්‍ය වටිනාකමින් යුත් ටෙන්ඩරය 2023 දෙසැම්බර් 22 දින සැපයුම්කරුවන් වෙත පිරිනමා තිබුණි. | තාක්‍ෂණික ඇගයීම් කමිටු වාර්තාව 2023.04.10 දිනට ප්‍රථම ලබාදීමට ප්‍රසම්පාදන කාලසටහන (PTS) අනුව නියමිතව තිබූ නමුත් ලබාදීමට හැකිව ඇත්තේ 2023.08.25 දින දීය. අනතුරුව 2023.10.09 දින පැවති ස්ථාවර අමාත්‍යමණ්ඩල ප්‍රසම්පාදන කමිටුව (SCAPC) | ප්‍රසම්පාදනය ක නියත කාලය තුළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව සිදු කර මිලදී ගැනීම කඩිනම් කිරීම හරහා අවිධිමත් මිලදී |

| | | | |
|---|---|---|---|
| | එනම් නියමිත දිනට මාස 07 කට පසුවය. මෙම මිලදී ගැනීම සඳහා 2022 නොවැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩලය විසින් තීරණයක් ගෙන ප්‍රසම්පාදන කටයුතු කඩිනම් කිරීමට නියෝග කර තිබුණද ඒ අනුව කටයුතු නොකිරීම හා ටෙන්ඩරය ප්‍රමාද කිරීම තුළ මණ්ඩලයට බස් රථ ඇණිය ධාවන තත්ත්වයේ පවත්වාගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂයට අවශ්‍ය ග්‍රීස් හා ලිහිසි තෙල් සඳහා රු.1,049,288,879 ක මුදලක් වැය කිරීමට සිදුව තිබූ අතර එහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තියට පටහැනිව කටයුතු කර තිබුණි. | කමිටුවේදී තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ අනුමත කළ අතර 2023.12.11 පැවති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2023.12.22 දින අදාළ ආයතන 02 වෙත ටෙන්ඩරය පිරිනමා ඇත. | ගැනීම් අත්හිටුවීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මණ්ඩලයේ බස් රථ ඇණිය සඳහා 2023 වර්ෂයට අවශ්‍ය අශෝක් ලේලන්ඩ් වැසි අමතර කොටස් මිලදී ගැනීම අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව මගින් සිදු කළ යුතුව තිබූ අතර, එය 2022 ඔක්තෝබර් 14 දින ආරම්භ කර 2023 මැයි 03 දින කොන්ත්‍රාත්තුව පිරිනැමිය යුතුව තිබුණි. අශෝක් ලේලන්ඩ් එන්ජින් හා ගියර් පෙට්ටි අමතර කොටස් මිලදී ගැනීම අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හරහා 2022 ඔක්තෝබර් 12 දින ආරම්භ කර 2023 අප්‍රේල් 02 දින කොන්ත්‍රාත්තුව පිරිනැමිය යුතුව තිබුණි. මෙම මිලදී ගැනීම් කඩිනම් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2022 නොවැම්බර් 14 දින ප්‍රතිපත්තිමය තීරණයක් ලබා දුන්නද අශෝක් ලේලන්ඩ් වැසි අමතර කොටස් මිලදී ගැනීමේ ටෙන්ඩරය පිරිනැමීම මාස 03 කුත් දින 16 ක් ප්‍රමාද වී තිබූ අතර, අශෝක් ලේලන්ඩ් එන්ජින් හා ගියර් පෙට්ටි මිලදී ගැනීමේ ටෙන්ඩරය මාස 08 කුත් දින 03 ක් ප්‍රමාද වී ප්‍රදානය කර තිබුණි. අශෝක් ලේලන්ඩ් එන්ජින් හා ගියර් පෙට්ටි අමතර කොටස් අයිතම් 533 ක් සඳහා ලැබී තිබූ ලංසු සඳහා තෝරාගත් ලංසුකරුවන් 07 දෙනෙකුට එයින් අයිතම 168 ක් සඳහා ප්‍රසම්පාදන සිදු කිරීමටත්, නැවත මිල කැඳවීමකින් තොරව ඉතිරි අයිතම 365 සඳහා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව මිලදී ගැනීම් සිදු කළ යුතු බවට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කර තිබුණි. අශෝක් ලේලන්ඩ් වැසි අමතර කොටස් 240 ක වාර්ෂික අවශ්‍යතාවය 74,256 ක් වූ අතර, මිලදී ගැනීමට තීරණය කර තිබූ ප්‍රමාණයෙන් මාස 04 ක අවශ්‍යතාවය වූ අයිතම 24,752 ක් සඳහා ඉදිරිපත් කර තිබූ ලංසු අනුව අමතර කොටස් 180 ක් සඳහා ලංසුකරුවන් 05 දෙනෙකුට රු.88,099,744 කට ටෙන්ඩරය පිරිනමා තිබූ | තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව 2023.04.10 දින ලබාදීමට නියමිතව තිබුණද, 2023.05.08 වන දින අමාත්‍යාංශය වෙත ලබාදී ඇත. 2023.05.16 දින පැවති SCAPC කමිටු රැස්වීමේදී TEC මගින් නිර්දේශිත සාරානුකූල අවම ලංසු ඉදිරිපත් කරන ලද ආයතන 05 ක් වෙත ප්‍රසම්පාදනය පිරිනැමීමට තීරණය කරන ලදී. ඒ අනුව පිරිනැමීමේ ලිපි 2023.09.15 වන දින එම ආයතන 05 වෙත නිකුත් කර ඇත. 2023.09.06 වන දින පැවති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC) කමිටු රැස්වීමේදී TEC මගින් නිර්දේශිත සාරානුකූල අවම ලංසු ඉදිරිපත් කරන ලද ආයතන 06 ක් වෙත ප්‍රසම්පාදනය පිරිනැමීම තීරණය කරන ලදී. 2023.12.05 වන දින ශ්‍රී ලං.ග.ම. සභාපති වෙත ලැබී ඇති අතර, ඒ අනුව, පිරිනැමීමේ ලිපි 2023.12.14 වන දින එම ආයතන 06 වෙත නිකුත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු අතර, අදාළ ප්‍රසම්පාදනයන් නියමිත කාලය තුළ නිමා කර අමතර කොටස් හිඟය නැති කර බස් රථ නියමිත පරිදි ධාවනයට යෙදවීම සඳහා අවශ්‍ය සහය ලබා දිය යුතුය. |

අතර ඉතිරි අයිතම 60 සඳහා අර්පනයක් නොතිබූ බැවින්, එම අයිතම් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වගන්ති 2.14.1 ට අතිරේක 35 ලෙස නිකුත් කර තිබූ 2020 මාර්තු 25 දිනැති නියෝගය අනුව ප්‍රසම්පාදනය කළ යුතු බව ටෙන්ඩර් මණ්ඩලය විසින් දන්වා තිබුණි. කෙසේ වෙතත් 2023 වර්ෂය තුළදී මෙම ටෙන්ඩර් දෙක ප්‍රදානය මගින් කිසිදු අමතර කොටසක් ලැබී නොතිබූ අතර, පාලන ගිණුම් අංක W-5 යටතේ ඩිපෝ හා ප්‍රාදේශීය කාර්යාල මගින් මිල සැළහුම් ක්‍රමය යටතේ මිලදී ගෙන තිබූ අමතර කොටස් සඳහා සමාලෝචිත වර්ෂය තුළ වැය කර තිබූ මුදල රු.2,032,617,464 ක් ව තිබුණි.

### 3.9 දෘශ්‍යමාන මූල්‍ය අක්‍රමිකතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෘත්තීය සමිතිවලට නිකුත් කළ බව සඳහන් දිවයින පුරා ගමන් කළ හැකි රු.1,247,739 ක වටිනාකමින් යුත් ගමන් අවසර පත් 04 ක් 2023 ජූනි 01 දින මුද්‍රණය කර තිබූ නමුත් එම ගමන් අවසර පත් මුද්‍රණය සඳහා ලද අයදුම්පත්, මුදල් ගෙවීම් ලදුපත් හා එම අවසර පත් මුද්‍රණය සඳහා ලබා ගත් අනුමැතිය හා එම අවසර පත් අදාළ වෘත්තීය සමිති විසින් භාරගත් බවට වූ තහවුරු ලේඛන විගණනයට ඉදිරිපත් නොවීය. ඒ අනුව එම ගමන් අවසරපත් අයථා පරිහරණයට යොදවා නොතිබූ බවට සෑහීමකට පත්වීම සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | පිළිතුර ලබා දී නොමැත. | පරීක්ෂා කර බලා අදාළ වගකිව යුත්තන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ඉන්ධන අර්බුදයක් පැවති කාලය තුළ අකුරැස්ස ඩිපෝව මගින් ශ්‍රී ලංගම හිටපු සභාපති වෙත මු.10 අංක 015287, 006473 සහ 006419 මගින් නිල වාහන නොවන වෙනත් වාහනයකට පිළිවෙලින් ඉන්ධන ලීටර් 400 ක් 620 ක් හා 476 ක් වශයෙන් එකතුව ඉන්ධන ලීටර් 1,496 ක් අවස්ථා 03 කදී ලබා දී තිබූ අතර, එම ඉන්ධන සභාපති වෙත නිකුත් කළ බවට තෙල් පිරවුම් පත්‍රයේ (ER-08) සටහන් කර තිබුණි. ඒ අනුව ශ්‍රී ලංගම හිටපු සභාපති වෙත නිකුත් කරන ලද රු.620,840 ක වටිනාකමින් යුත් ඉන්ධන ලීටර් 1,496 ක ප්‍රමාණය සාවද්‍ය පරිහරණයට යොදවා නොතිබූ බවට සෑහීමකට පත්වීම සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | මෙහි සඳහන් කර ඇති පරිදි ශ්‍රී ලං.ග.ම. හිටපු සභාපතිතුමා වෙත ඉන්ධන ලබාදී ඇත. එසේ ඉන්ධන ලබා දී ඇත්තේ මෙහි දක්වා ඇති පරිදි මුදල් අයකර ගැනීමෙනි. | මේ පිළිබඳ පරීක්ෂණයක් කර සිදු වූ පාඩුව අය කර ගැනීමටත් සම්බන්ධිත පාර්ශව සඳහා විනය ක්‍රියාමාර්ග ගැනීමත් කටයුතු කළ යුතුය. |

### 3.10 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 හා 2006 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛ මණ්ඩලයේ ප්‍රාථමික මට්ටමෙන් ඉහළ තනතුරු වන I ශ්‍රේණිය VIIA ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල කටයුතු කරන කාර්යය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සකස් කර නොතිබූ අතර එකී චක්‍රලේඛය අනුව කාර්යය මණ්ඩලය අදාළ තනතුරු වලට අන්තර්ග්‍රහණය කිරීමකින් තොරව 2016 වර්ෂයේ සිට ඔවුන්ට වැටුප් හා දීමනා ගෙවනු ලබන අතර 2023 වර්ෂයේ දී පමණක් එකී කාර්යය මණ්ඩලයට වැටුප් හා දීමනා ලෙස රු.1,589,164,734 ක් සාවද්‍ය ලෙස ගෙවා තිබුණි. | ප්‍රාථමික ගණයේ ඉහළ නිලධාරීන් සඳහා (I) ශ්‍රේණියේ සිට VIIIB ශ්‍රේණිය දක්වා) කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව විසින් අංක DMS/1622/Vol .III දරන 2022.09.28 දනැති කළමනාකරන සේවා චක්‍රලේඛ අංක 02/2016 විධි විධාන අනුව නව වැටුප් ව්‍යුහය නිර්දේශ කිරීම මැයෙන් නිකුත් කරන ලිපිය පදනම් කරගෙන 2023.03.01 දින සිට කාර්ය මණ්ඩල වැටුප පරිවර්තනය කර ඇත. තවද කාර්ය මණ්ඩල සඳහා බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටිය 2024.02.14 දින අනුමත කර ඇත.<br>තවද 2023.03.01 දින සිට ශ්‍රී ලං.ග.ම. කාර්ය මණ්ඩල වැටුප් පරිවර්තනය කිරීමක් පමණක් සිදු කරන ලද අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවේ අනුමැතිය මත ගෙවීම් කර ඇති බවත්, කිසිදු ගෙවීමක් සාවද්‍ය ලෙස ගෙවා නොමැති බවත් සඳහන් කරමි. | බඳවා ගැනීමේ පරිපාටියට අන්තර් ග්‍රහණය කර නිවැරදිව වැටුප් ගෙවිය යුතු අතර, වැඩියෙන් ගෙවූ වැටුප් අය කර ගත යුතුය. |
| (ආ) | රියදුරු හා කොන්දොස්තර මහතුන්ගේ අතිකාල වියදම් හැර කාර්යාල හා අනෙකුත් වැඩබිම් කාර්යය මණ්ඩලයන්හි සමාලෝචිත වර්ෂයේ අතිකාල වියදම රු.මිලියන 896 ක් වූ අතර, 2022 වර්ෂයේ අතිකාල වියදම වන රු.මිලියන 671 හා සංසන්දනයේදී අතිකාල වියදම රු.මිලියන 225 ක් එනම් සියයට 33 ක ප්‍රමාණයකින් වැඩි වී තිබුණි. අදාළ සේවකයන්ට සාමාන්‍ය රාජකාරි වේලාවන්හිදී ඉටු කළ යුතු කාර්යය පිළිබඳව රාජකාරි ලැයිස්තු ලබා නොදීම, ඇඟිලි සලකුණු යන්ත්‍ර හරහා පැමිණීම හා පිටවීම සනාථ කර ඒ අනුව | 2022 ට වඩා 2023 වර්ෂයේ දළ වශයෙන් 33% ආසන්න ප්‍රමාණයකින් අතිකාල වැඩිවීම පිළිගනී. ශ්‍රී ලං.ග.ම. අතිකාල ලේඛන ගත හා ලේඛන ගත නොවන වශයෙන් කොටස් දෙකකින් ලබා දෙනු ලබයි. මෙහිදී විශේෂයෙන් ලේඛන ගත අතිකාල පාලනය කල නොහැකිය. | ස්වයං පාලන ක්‍රමවේද හරහා අතිකාල පාලනයට ක්‍රියාමාර්ග ගැනීම හා අතිකාල අධීක්ෂණයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

අතිකාල ගණනය නොකිරීම, පාලනයකින් තොරව අඛණ්ඩව දිවා රාත්‍රී එක දිගට දින දෙකකට වැඩි කාලයක් අතිකාල රාජකාරිවල නිරතවීම අසාමාන්‍ය ලෙස අතිකාල වර්ධනය වීමට හේතු වී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 15 වන වගන්තියට 2023 වර්ෂය සඳහා මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා ශ්‍රී ලං.ග.ම. වාර්ෂික වාර්තාව කෙටුම්පත් කරමින් පවතින අතර කෙටුම්පත් කර අවසන් වූ වහාම ඊට අදාළ කෙටුම්පත ඔබ වෙත ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | වාර්ෂික වාර්තාව කඩිනමින් නියමිත දින වකවානු වලට පෙර ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021<br>මණ්ඩලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට සහ වාර්ෂික අයවැය ලේඛනයට සම්බන්ධිතව පුරෝකථනය කරන ලද ඉදිරි වර්ෂ 05ක් සඳහා සකස් කළ යුතු උපාය මාර්ගික සැලැස්ම චක්‍රලේඛ විධිවිධාන අනුව පිළියෙල කර නොතිබුණි. | ශ්‍රී ලං.ග.ම. විසින් වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කරනු ලබයි. | චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අයවැය හා උපාය මාර්ගික සැලැස්ම සකස් කළ යුතුය. |

### 4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තිය<br>ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කිරීමේදී අයවැයගත ආදායම් හා වියදම් ප්‍රකාශනය, අයවැයගත ශේෂ පත්‍රය, අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අයවැයගත ප්‍රාග්ධන වියදම් ඉදිරිපත් කළ යුතු වුවත් මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අයවැය ගත ආදායම් වියදම් ප්‍රකාශන සහ අයවැය ගත ප්‍රාග්ධන වියදම් සකස් කර අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛයට අනුව ක්‍රියාකාරි සැලැස්ම සකස් කළ යුතුය. |

**4.4** **අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට අනුව රු.මිලියන 134,341 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 53 ක් සැලසුම්කර තිබුණද 2023 වර්ෂය තුළදී රු.මිලියන 74,662 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 11 ක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව 2023 වර්ෂයේ අයවැයට ඇතුළත් කරන ලද ප්‍රසම්පාදන වියදමෙන් සියයට 44.42 ක් පමණක් උපයෝජනය කර ඇති බැවින් අය වැය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි. | සමහර ප්‍රසම්පාදන සුළු පරිමාණ ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වෙළෙඳළ මිළ ගණන් සලකා බැලීමේදී ඉතා ඉහළ අගයක් ගන්නා බැවින් ප්‍රසම්පාදන කමිටුව විසින් අදාළ ප්‍රසම්පාදනයන් සඳහා නැවත ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුව ප්‍රසම්පාදනය සිදුව නොමැති අතර, අයවැය සකස් කිරීමේදී විචක්ශණශීලී ව කටයුතු කළ යුතුය. |

**4.5** **තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතින්ගේ තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රයට අනුව එම න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට අදාළ වන අරමුණ හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය සම්පත් හා ධාරිතාවන් සුරක්ෂිත කිරීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබූ අතර, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම පරීක්ෂා කිරීම සඳහා මණ්ඩලය විසින් භාවිතා කරන කාර්යය සාධන දර්ශක (KPI) මොනවාද යන්න හඳුනාගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත | එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය අනුව මණ්ඩලය විසින් හඳුනාගත් කාර්යසාධන දර්ශක (KPI) සකස් කර ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතු වේ. |